# මල් විදුරු

## සැඟවුණු වාසනාවක් ...

ඩබ්.පී.සේසතිනි දිල්මිණී යාලිංගසිංහ

# මල් වීදුරු

## සැඟවුණු වාසනාවක් ...

ඩබ්.පී.සේසතිනි දිල්මිණි යාලිංගසිංහ

දෙවන කෘතිය
නිකුත් කල දිනය :- පළමු පිටපත
2023/12/01

කතෘගේ වෙනත් කෘතීන්
පළමු කෘතිය :- අම්බලම

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුෂලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුකරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# කතුවැකිය

දශක දෙකකටත් අඩු මගේ දිවියේ මා අත්විඳි බොහෝ සුන්දර අත්දැකීම් පාදක කරගනිමින් මගේ නිර්මාණ ගොන්නට එක්වන තවත් සාමාජිකයෙකු වන ''මල් වීදුරු'' නවකතාව පිළිබඳ පාඨක ඔබට මෙසේ හැඳින්වීමක් කරමි.

මගේ දිවියේදී මා අසා ඇති බොහෝ දුක්බර ජීවන කතාවේ. නමුත් ඕනෑම කතාවක දොම්නස මෙන්ම සොම්නස වැනි හැඟීම් ද වේ. එවන් කතා දුක්බර ලෙස ඇරඹුණද අවසන සොම්නසින් අවසන් වේ. ඒ එම කථාවෙහි කියවෙන චරිතය තුළ වූ වීර්යය හා උත්සාහය යන ගුණාංග නිසාවෙනි යැයි සිතිය හැක. මල් වීදුරු'' නවකතාව ද එවන් කතාවකි.

හද්දා පිටිසරයක දිවි ගෙවන ගැමියෙකු තුළත් නාගරික පරිසරයක දිවි ගෙවන නාගරිකයකු තුළත් ජනිත වන හැඟීම් අහසට පොළොව සේ දුරය. අහස් ගව් ගණන් දුරය. ඇතැම්විට ඒවා එසේ වනුයේ කෙසේදැයි සිතීමට පවා නොහැක. එවන් වූ ගැමි දිවියකින් ඇරඹී සියලු දුක් කම්කටොලු වලට නොබියව නොසැලීව මුහුණ දෙන්නෙකු මගේ කතාවේ ප්‍රධාන චරිතයයි. මෙය මා විසින් රචනා තෙවන ග්‍රන්ථයයි. මෙය කියවා රස විඳින්නැයි පාඨක ඔබට මං පාදමින් ''මල් වීදුරු'' යොවුන් නවකතාව ඔබ වෙත මෙසේ ගෙන හැර පාමි.

මීට

ඩබ්.ජී.එස්. දිල්මිණි යාලිංසිංහ
අංක 134
අත්තරගම
පට්ටියාවත්ත
2020-12-29

## පිදුම

***ආදරණීය අම්මාටත්,***

***අප්පච්චිටත්,***

***මාමාටත්***

***සෙනෙහසින් පුදමි……***

# 01. මුලාවකින් මලගමක්

''කොලුවො උඹ මේ කොහේයන ගමන් ද? ''

ගුරු පාර දිගේ දිවයන සිරිමල්ගේ මග හරස් කරමින් සියාතු සීයා ඇසුවේය.

''අහකට වෙන්ට සීයෙ අප්පච්චි මාව පන්නනවා'' ඔහු පිළිතුරු දුන්නේ ය.

'' ඒ මොකටද ? අනිවාර්යෙන් උඹ මොකක් හරි අලුගුත්තේරු වැඩක් කරන්නට ඇති.''

'' අනේ සීයෙ අහකට වෙලා මට යන්ට දෙන්ට."

ඔහොම හිටපන්, උඹ මගෙන් හොඳට කනවා'' සිරිමල්ට තම පියාගේ කෝපාන්විත හඬ යළිත් ඇසෙන්නට විය.

ඔහු මහල්ලාගෙන් මිදී යළිත් දිව ගියේය. ඔහු ගුරුපාර අවසන් වනතුරුම දිව ගියේය. දැන් ආපසු හැරීම මිස ඔහුට වෙන කිසිවක් කිරීමට නොවීය. ඔහුට යළිත් තම පියාගෙ කෝපාන්විත හඬ ඇසිණ. ගුරු පාරෙහි අවසාන කෙළවර අසල වූයේ ඝන කැලයකි. ගුරු පාරට පහලින් වූයේ සැර පරුෂ ලෙස ගලා යන මහවැලි ගඟේ අතු ගංගාවකි. සිරිමල්ට කදිම උපායක් සිහිපත් විය. ඔහු ගං ඉවුර වෙත ගොස් ඒ අසල තම පාවහන් යුගල ගලවා අසල වූ උණපඳුරක තම කමිසද ගලවා එල්ලුවේය. අනතුරුව ඔහු අසල පොල් ගසක් යට වැටී තිබූ පොල් ගෙඩි තුනක් අහුලා ගෙනවිත් විශාල හඬක් නැගෙන සේ ගංගාවට කළේය. ඉන්පසු ඔහු හනික කැලය වෙත දිව ගියේය.

***************

කාලය ගෙවී යන්නට විය. අඳුර වැටෙන තුරු සිරිමල් වනාන්තර පුරා ඇවිද ගියේය. ඔහුගේ අදහස වූයේ අඳුර වැටුනු පසු යළිත් තම නිවස වෙත යැමටයි. නමුත් ඔහුට තමා අතරමං වූවා යන හැඟීම දැනෙන්නට විය. හෝරා ගණනාවක් එක්වර ඇවිද යාම නිසාවෙන් ඔහුට දැඩි කුසගින්නක් හා පිපාසයක් දැනෙන්නට විය.

එමෙන්ම ඔහුගේ සිරුර පුරාවට සීරීම් තුවාලද විය. ඔහු සියලුම පීඩාවන් විඳිමින් ඉදිරියට ගියේය. ඒ යන අතර මග ඔහුට කුඩා දිය පහරක් හමුවිය. ඔහු එයින් වතුර පානය කර නැවත ගමන් ඇරඹුවේය. අඳුර වැටී තිබුණ ද ඔහුට මාර්ගය පෙනෙන තරම් ආලෝකයක් විය. ඔහු ඇවිද යනවිට ඔහු එක්වරම යමක පය පැකිලී බිම ඇද වැටුණේය. ඔහු බිම දිගාවී එය කුමක්දැයි අතගා බැලුවේය. එය කඩා වැටුණු කණුවක පාදම කොටසකි. ඒ සමගම ඔහුට යම් නව බලාපොරොත්තුවක් ඇතිවිය.

'' මට හිතෙන්නේ මේ ළඟපාත ගෙයක් තියෙන්ටම ඕනි. එහෙම වුනොත් මට අද රෑ එහෙ නිදාගන්ට පුළුවන් වෙයි.'' සිරිමල් තමාටම කියා ගත්තේය. ඔහු පය ඉක්මන් කරන්නට වූයේය.

***************

'' ලීලාවති නගා! ලීලාවතී නගා! ''වැට කඩුල්ලට එපිටින් එකියක කෑගසන්නට වූවාය. කුඩා දියණියට බත් කවමින් උන් සිරිමල්ගෙ මව ලීලාවතී නැබිලියට වතුර වත්කර අත සෝදා තම වීත්ත රෙද්දෙ අත පිස දමමින් මිදුලට ආවාය.

'' මොකෝ අක්කේ මේ කලබලවෙලා?''

'' සිරිමල්! '' ඇය තනන්නට වූවාය.

''ඇයි මයේ කොල්ලට මක් වෙලාද?''

'' සිරිමල් කොල්ලා ගඟට පැනලා නගා!''

'' මොකක් කිව්වා, අනේ මයෙ කොලුවා! යමන් අක්කේ ගං ඉවුරට'' ඕ හඬමින් කීවාය. ''ලොකු පුතේ නංගිවත් වඩාගෙන වරෙන් ගං ඉවුරට''

ගමේ ගම්මු සියල්ලෝම ගං ඉවුරට රැස් වී කතා බස් කරමින් උන්හ.

සිරිමල්ගෙ මව ලීලාවතීත් කමලාවතීත් අඳු කොළ දුටු සර්පයන් සේ ගං ඉවුර වෙත දිව ආහ. සිරිමල්ගෙ පියා සිරිපාල ගලක් මත හිඳගෙන නිසොල්මනේ ගංගාව දෙස බලා සිටියේය.

'' මයේ දෙයියෝ කියාපංකො මගේ කොල්ලා! කියාපන් කෝ මගෙ කොල්ලා!'' ලීලාවතී මර ළතෝනි දෙන්නට වූවා ය. ඇය තම සැමියා වෙත නැඹුරු වී වැළපෙන්නට වූවාය.

'' උඹේ මිනිහා නම් උඹට කොල්ලා ගැන කියන එකක් නෑ බොල!''

'' එහෙනම් උඹවත් කියාපංකො අයියේ? ''

" උඹේ කොල්ලා හුහක් වෙලා මැණික් ගර ගර උන්නා. කොල්ලට තෙහෙට්ටු හන්දා කොල්ලා ඩිංගිත්තක් ගොඩට ගියා. මෙන්න උඹේ මිනිහා කොළුවාට තඩි බාන්න ගත්තා?''

'' ඒ මක්කටැයි අයියේ?'' අසල සිටි තවත් එකියක් විමසන්නට වූවාය.

'' කොල්ලා ගොඩට ගිය හන්දා නෙවැ බොල. මේ අද ඊයේ දෙයක් නොවේ නගා. ඌට බත් ඩිංගිත්තක් කන්නට වත් උඹේ මිනිහා ගොඩට යන්ට දෙන්නේ නැහැ. කොටින්ම කිව්වොත් දොට්ට පිලට යන්න ඇහුවත් ගොඩට යන්ට දෙන්නෙ දෙකක් තුනක් ඇනලා.''

'' ඉතින් කොල්ලා අප්පගෙ තඩි බෑවිල්ලෙන් බේරෙන්ට ගුරු පාර දිගේ දුවන්ට ඇති සිරිපාලට ඇහිලා කොල්ලා දියට පනිනවා.අර තියෙන්නේ කොල්ලා ගේ කමිසෙයි, රබර් සෙරප්පු දෙකයි'' තව එකෙක් කතාබහට හවුල් වෙමින් කීවේය.

''නාඩා ඉදින් නගා පොලිසියේ මහත්වරුන් එනවා ඒ උත්තමයෝ කොල්ලව බේරාගනී.''

***************

සිරිමල් ගසකට හේත්තු වී හති අරිමින් සිටියේය. හිරු බැස යමින් තිබුනද ගස් අතරින් යමක් දිලිසෙන අයුරු ඔහු දුටුවේය. ඔහු එය සොයමින් ඉදිරියට ගියේය. අසලට යන විට ඔහු දුටුවේ විස්මයජනක දෙයකි. එය ගරා වැටී තිබූ බංගලාවක වහලෙහි රඳවා තිබූ කුරුසයකි. එම බංගලාව වටා කැලෑව වැවී තිබුණ බැවින් පිටතින් බලන්නකුට එය සොයා ගැනීමට ද අපහසුය. ගසකින් සවිමත් අතු කැබැල්ලක් කඩාගත් සිරිමල් එය එහෙට මෙහෙට වනමින් බංගලාවේ දොර අසල ශුද්ධ පවිත්‍ර කළේය. අනතුරුව සිරිමල්ගෙ ආශාව වූයේ බංගලාව ඇතුලට යාමයි. ඔහු එහි දොර තල්ලු කළේය. නමුත් එය සෙලවුනේ වත් නැත. ඔහු යළිත් මදක් පසුපසට ගොස් දොර වෙත කඩා පැන්නේය. එවර එය විවර වූයේ සිරිමල්වද බිමට තල්ලු කරමිනි. ඔහු නැවතත් බිම ඇදගෙන වැටුණේ ය. මහත් නොඉවසිල්ලෙන් සිටගත් ඔහු බංගලා වටා කැරකී බලන්නට විය. ඔහු සිටින්නේ බංගලාවේ ආලින්දයේ බව ඔහුට වැටහිණි. එහි වූයේ පැරණි මෝස්තරයකට තනන ලද කවිච්චි දෙකක් හා කුඩා කෑම මේසයක් හා තමත් පුටු යුගලයකි. බංගලාවට දමා තිබු තිර රෙදි ද දිරා ගොස් තිබිණ. ඊළඟට ඔහු පිවිසියේ කුඩා නිදන කුටියකට ය. එහි පසෙක අඳක් විය. එහි ඇඳ රෙද්ද පමණක් දිරා ගොස් තිබිණ. මෙට්ටය හොඳ තත්වයේ පැවතිණ. අනික් පස වූයේ කුඩා අල්මාරියක් සහ තවත් පැරණි මෝස්තරයෙන් යුතු කුඩා මේසයක් සහ පුටුවකි. සිරිමල් අල්මාරිය වෙත ගියේය. එහි හැඬලයෙ වී.ඕ.සී. යනුවෙන් ඉංග්‍රීසි අකුරෙන් කොටා තිබුණේය. ඔහු එහි හැඬලය කැරකුවේය. ඔහුට තම දෑස් අදහාගත නොහැකි විය. එහි පසෙක කළු පැහැති ලෝගු දෙකක් හා මනාව නමා තබා ඇති ඇඳ ඇතිරිලි සහ කොට්ට උර ආදිය විය. එහි දෙවැනි තට්ටුවේ පැරණි කොට්ට දෙකක් හා විවිධ දේ තිබිණ. යටම තට්ටුවේ පැරණි ඉටිපන්දම් රාසියක්ද විය.

පරිසරය අඳුරු වීමට පෙරින් රැය ගත කිරීමට තැනක් සොයා ගත යුතු බව සිරිමල්ට සිහිපත් විය.

''මේ අදට ඇති! අඳ රෑට නම් මට බඩගින්නෙම තමයි නිදි යන්ට වෙන්නේ! වෙන තැන් හොයන්නේ මොකටද මට අඳ රෑට මේ ඇඳේම නිදියන්ට පුළුවන්නේ! '' ඔහු තමාටම කියා ගත්තේය.

ඔහු ඇඳට දමා තිබූ ඇඳ රෙද්ද ගසා ඉවත් කර ඊට අලුත් ඇද රෙද්දක් ගෙන එලුවේය. පසුව අල්මාරියේ වූ පැරණි කොට්ට දෙකද ගසා දමා ඒවාට අලුත් කොට්ට උර දැම්මේය. දැන් ඇඳට නව පෙනුමක් ලැබී ඇති බව සිරිමල්ට වැටහින. ඉන්පසු ඔහු වෙනත් ඇද ඇතිරිල්ලක් ද පිටතට ගත්තේ පොරෝනාවක් ලෙස භාවිතයට ගැනීමටයි. මෙතෙක් වේලා පැවැති උද්යෝගය නිසාවෙන් පරිසරයේ වූ සිසිලස පවා ඔහුට නොදැනිණ. ඔහු පොරෝනාව ගෙන එය තමා වටා දවටා ගත්තේය. අනතුරුව ඔහු බංගලාවේ දොර වසා දැමීමට ගියේය. එක්වරම අහසින් ගෙරවුම් හඬක් නිකුත් විය. නැවතත් අකුණු කොටන්නට විය. ඔහු හනික අකුණු ආලෝකයෙන් බංගලාවේ වහලය වෙත නෙත් හෙළුවේ ය. බැලූ බැල්මට වහලය මෑතකදී පිළිසකර කළාක් මෙන් යහපත් තත්වයේ පැවතිණ. ඔහු කුඩා නිදන කුටියට ගොස් ඇඳ මත හිඳ ගෙන එහි සවිමත් බව පිරික්සා ඒ මත වැතිරුණේ ය. සිරිමල්ට එනිසා මහත් සැහැල්ලුවක් දැනිණි. එක්වරම වැසි ඇද හැලෙන්නට විය. ඔහු තවත් ගුලි වී නිදන්නට සැරසුණේය. නමුත් ඔහු සිතූ තරම් ඉක්මනින් නින්ද ඔහුව සොයා නාවේය. සිරිමල්ට තම ආදරණීය මව හා සොහොයුරාත්, නැගනියත් සිහිපත් විය. තමාට නිතර දඬුවම් කරන පියාවද සිහිපත් විය. වෙනදා ඔහු නිදන නිදි පැදුරට වත් වඩා මෙම යහන සැප පහසු යැයි ඔහු සිතුවේය.

'' ඒත් මෙච්චර පරණ බංගලාවක් කොහොමද මෙච්චර හොඳට ආරක්ෂා වෙලා තියෙන්නෙ? මේ බංගලාවේ කවුරුහරි මේ ළඟක් වෙනකන් ජීවත් වෙලා තියෙනවා. ඒත් ආතා කියල තියෙන විදියට ගමේ මිනිස්සු සුද්දා මෙරටින් ගියාට පස්සේ මේ කැලෑවට කවුරුත් ඇවිල්ලා නෑ.

ඒ කාලේ ඉඳලා මිනිස්සු විශ්වාස කරලා තියෙනවා ලන්දේසින්ගෙයි, ඉංග්‍රීසීන්ගෙයි අවතාර මෙහි ඉන්නවා කියලා. ඒත් කවුරු හරි මේ බංගලාවේ ජීවත් වෙලා තියෙනවා ඇත්තටම කවුද? ඔහු එසේ සිතමින් තමා සමග තර්ක කරගත්තේය.

'' මීට අවුරුද්දකට විතර කලින් පොලිසියේ මහත්තුරු වගයක් කොළඹ පළාතෙන් පැනලා ආපු හොරෙක්ව අල්ලා ගත්තා නේද, අපේ කඩමණ්ඩිය ගාවදී, ඒ මිනිහවත් මේ බංගලාවේ හැංගිලා හිටියද දන්නෙ නෑ.

කමක් නෑ හෙට උදේට මේකේ ඇත්ත නැත්ත හොයාගන්ට පුළුවන් වෙයිනේ '' එසේ සිතමින් සිටි ඔහු නොදැනීම නිදි දෙව් දුවගේ ඇරයුම් ලද්දේය.

***************

පසුදා උදෑසන අවදි වූ ඔහු දිය පහර අසලට ගොස් පිරිසිදු විය. සවස් වරුවේ සිට ආහාරයක් නොවීම නිසා ඔහුගේ අදහස වූයේ කෑමට යමක් සොයා ගැනීමයි. ඔහු බංගලාව අවට විපරම් කළේය. බංගලාව පිටුපස කුරුම්බා ගසක් විය. ඔහු ගසට නැග කුරුම්බා ගෙඩි දෙකක් බීමට බෑවේය. ඒ අසලම අනෝදා ගසක්ද විය. ගසේ අතුපුරා අනෝදා ගෙඩි වලින් බර වී තිබිණ. මේවායේ පලදාව නෙලීමට ලේනුන්, කුරුල්ලන් මිස වෙනත් අයිතිකාරයෝ නො වීම ඊට හේතු විය.

'' කුරුම්බා තිබ්බට කපාගෙන බොන්නේ මොකෙන්ද? බංගලාවේ හොයලා බලන්න ඕනේ සමහරවිට හම්බවේවි. සොයන්නාට සම්බවේවි කියලා කතාවකුත් තියෙනවා නෙව.'' සිරිමල් එසේ සිතමින් බංගලාවේ මුළුතැන්ගේ සොයමින් ගියේය. මෙම කුඩා බංගලාවේ වූයේ කුඩා බරාදයකුත්, මුළුතැන්ගෙයකුත්, ගබඩා කාමරයකුත් පමණි. කුඩා මුලුතැනේගයි වූ දිරාගිය මේසයත්, බංකුවත් ඇරෙන්නට වෙන යමක් නොවීය. නමුත් දිරාගිය මේසය මත විශාල බෑගයක් හා ඉටි කොළයකින් එතූ කිසිවකුත් විය. සිරිමල් මහත් උද්යෝගයෙන් එම මේසය වෙත ගියේය. මුලින්ම ඔහු විශාල බෑගය විවර කර බැලුවේය.

එහි වූයේ කළු පැහැති හා නිල් පැහැති දිග කලිසම් දෙකකුත්, විවිධ පාටින් යුත් කමිස හතරකුත්, නිල් හා රතු පැහැති සපත්තු ජෝඩුවකුත් ය. මීළඟට ඔහු දුටුවේ බලාපොරොත්තු නොවූ යමකි. ඒ ඔහු බොහෝ කලක සිට මිලදී ගැනීමට සිහින මැවූ අව් කණ්ණාඩියකි. ගමේ පොලේ දී ඔහු දුටු අව් කණ්ණාඩියට වඩා මෙය ඉතා අලංකාර යැයි ඔහු සිතුවේය. අනතුරුව ඔහු දිගහැර බැලුවේ ඉටිකොළ වලින් ඔතා තිබූ බඩු පොදියයි. ඔහු බලාපොරොත්තු වූ දෙය ම එහි විය. එහි කුඩා මන්නා පිහි දෙකක් හා ගිනි පෙට්ටි කිහිපයක් විය.

පසුව ඔහු විශාල බෑගය හා මන්නා පිහි දෙක රැගෙන කාමරයට පිට වීමට සූදානම් වූයේය. එක්වරම යමක් ඔහුගේ පාදය මතට වැටිණ. එය නවීන මෝස්තරයේ හිස් වැසුමකි. මහත් ආශාවෙන් එය පැළඳ ගත් ඔහු කාමරය වෙත ගියේය මහත් ආශාවෙන් ඒ පැළඳ ගත් ඔහු කාමරය වෙත ගියේය.

***************

අනෝදා කැබැල්ලක් කා කුරුම්බා ගෙඩියක් බී කුස පුරවා ගත් සිරිමල් ගබඩාව වෙත ගියේය. ගබඩාව ඉතා කුඩා ප්‍රියමනාප ස්ථානයක් විය. එහි පසෙක පොරවක්, උදැල්ලක්, අලවංගුවක් හා තවත් නොයෙක් ආයුධ විය. සිරිමල්ට එකවරම යමක් සිහිපත් විය.

'' මං ඊයේ රෑ හිතපු දේ හරි එහෙනම්! අර හොරා හැංගිලා ඉඳලා තියෙන්නේ බංගලාවේ වෙන්න ඕන. හොරාට පින්සිද්ද වෙන්න මම ආසකරන දේවල් ගොඩක් මට හම්බ වුණා. කිරි එළදෙනක් විකුණලාවත් මට මේ දේවල් ගන්ට වෙන්නේ නෑ. කොහොමත් සුද්දොන්ගේ කාලේ තිබ්බ දේවල් වෙන්ට බෑ මේ ආයුධ! මේ ඔක්කොම හොර මහත්තයාගේ වැඩ, ඔහු සිතුවේය.

***************

'' මේ තාම උදේ වරුනේ! දැන්ම ගෙදර යන්ට පිටත් උනොත් හවස් වෙන්ඩ කලින් යත හැකි වෙයි. අයියාට හොද විහිළුවක් කරන්ට හොඳම වෙලාව තමයි මේ'' එසේ සිතූ ඔහු මහත් උද්‍යෝගයෙන් ඔහුට හමු වූ බෑගයෙන් අත් දිග කමිසයක් හා කළු පැහැති කලිසමක් ඇද ගත්තේය. ඔහු බෑගයේ වූ සාක්කුවක් විවර කර බැලුවේය. එහි කළු පැහැති මේස් කුට්ටම් තුනක් විය. එක කුට්ටමක් දමා ගත් ඔහු සපත්තු ජෝඩුව ද පැළඳ ගත්තේය. එම ඇඳුම් පැළඳුම් සියල්ලම ඔහුට මැස් වූ ඒවා සේ සිරිමල්ට ගැළපිණ.

'' තව එක දෙයක් අඩුයි.'' තමාට කියා ගත් ඔහු හිස්වැසුම ද පැළඳ ගත්තේය. අනතුරු අව් කණ්ණාඩිය ද ගෙන තම කමිසේ රඳවා ගත්තේය.

'' දැන්නම් මං නියම කොළඹ මිනිහෙක්! කාටවත් මේ කපේදි මාව අඳුනගන්න බැහැ. මේ මොකක්ද මේ?'' ඔහුට කලිසමේ තිබූ යමක් හසුවිය.

ඔහු එය පිටතට ගෙන බැලුවේය. එය මුදල් පසුම්බියකි. සිරිමල් මහත් නොඉවසිල්ලෙන් එය විවර කර බැලුවේය. එහි රුපියල් දාහේ නෝට්ටු නවයක්ම විය. ඔහු ගමන පිටත් වීමට පෙර කුරුම්බා ගෙඩියක් කපා බිව්වේය. ඔහු බෑගයක එල්ලාගෙන ගමන පිට  ඔහු බෑගයද එල්ලාගෙන ගමන පිටත් වූයේය.

***************

හෝරා තුනක පමණ ගමනකින් පසු සිරිමල් ගුරු පාරේ කෙළවරට පැමිණියේය. ''කාටවත් මාව අඳුනගන්න පුළුවන් වෙන්ට කලින් මේක දා ගන්ඩ ඕනේ.'' එසේ සිතූ සිරිමල් කමිසයේ රඳවා තිබූ අව් කණ්ණාඩිය පැළඳ ගත්තේය. මද දුරක් ඇවිද ගිය ඔහුට ඈතින් දුක්බර වැලපුම් ගීයක් ඇසින. තුන් මන් හන්දිය අසළින් හැරුණු සුදු හැඳගත්, හඬමින් පැමිණෙන පිරිසකගේ සේයාරුවක් සිරිමල්ගේ නෙතට හසු විය. ඒ ඔහුගේ පවුලේ ඥාතීන් හා ගමේ අසල් වැසියන් පිරිසක් බව ඔහු දුරතියාම හඳුනා ගත්තේය. සිතුවිල්ලෙන් සිතිවිල්ලෙන් ඔහු පිරිස අසලට ම පැමිණියේය.

සිරිමල් ගේ මව '' අනේ මයෙ දෙයියෝ ඇයි උඹ මෙහෙම දෙයක් කරගත්තේ'' කියමින් අඬන්නට වූවාය. ඔහුගේ පියා සිරිමල්ගේ බාල සහෝදරියත් වඩාගෙන පිරිස අතරින් නිසොල්මනේ ඇවිද ගියේය. සිරිමල්ගේ වැඩිමහල් සිරිමල්ගේ මවව තුරුළු කරගෙන හඬමින් පිරිසක් සමග ඉදිරියට ඇදුණේය. සිරිමල්ගේ මනසට යම් කුහුලක් ඇතිවිය. ඔහු ගමේ මුදලාලිගෙන් ඒ පිළිබඳව විමසුවේය.

'' ඒයි ලොකු උන්නැහේ, කාගෙද මේ මලගම?'' ඔහු ටවුමෙ චණ්ඩියකු අනුකරණය කරමින් විමසුවේය.

'' අනේ මහත්තයෝ මේ ගමේ සිරිමල් කියලා කොලුවෙක්! ගහට පැනලා පණ නහගෙන.

ඊයේ උදෑහැනැක්කේ තමයි අර ගඟේ ගල් පරයක් උඩ මිනිහා මිනිය තිබිලා හම්බ උනේ, මිනිය අඳුන ගන්නවත් බැරි තරමට විරූපී වෙලයි තිබුණේ මහත්තයෝ''

'' ලොකු උන්නැහේ මේ ළඟපාත බස් නැවතුම්පොළක් එහෙම නැද්ද?'' සිරිමල් කතාව වෙනතකට හරවමින් විමසුවේය.

'' මේ හද්දා පිටිසර මහත්තයෝ! මේ කොළඹ රට නෙවෙයි. අපේ ගමට බස් එකක් නෑ.'' එසේ පිළිතුරු දුන් ඔහු පිරිස හා එක් වූයේ ය.

සිරිමල්ට ඔහුගේ හද එක්වර නතර වූවා සේ හැඟිණ. ඔහුගේ කුහුල නිවැරදි විය. ඔහු අසල වූ හේනක දඬු වැටට හේත්තු වී නිසොල්මනේ බලා සිටියේය.

'' මන් දැන්මම ගෙදර ගිහින් මගේ ඇඳුම් ටිකකුත් අරගෙන ආපහු කැලේට යන්න ඕනේ!'' එසේ සිතූ ඔහු තම නිවස වෙත ගියේ ය.

***************

සිරිමල් තම නිවසට යන විට නිවසෙහි කිසිවෙක් නොවීය. ඔහු තමා ගෙන ආ බෑගයට තමාගේ ඇඳුම් පැළඳුම් කිහිපයකුත් මුල්ලක සඟවා තිබූ තමාගේ කැටයත් දමා ගත්තේය. ඔහු තමාට අවැසි වෙතැයි සිතූ ලිපි ලේඛන කිහිපයක් දමා ගැනීමට අමතක නොකළේය.

නිවසින් පිටත් වන අතරේ ඔහු අනාගතයේ පිළිබඳ සැලසුම් කළේය.

'' මම කඩ මණ්ඩියෙන් හාල් තුනපහ ටිකකුයි, එළවළු ටිකකුයි, වලන් ටිකකුයි තව ලන්තෑරුමකුයි ගන්ට ඕනෑ. ඉතුරු හරිය හෙටම ටවුමට ගිහින් ගන්ට ඕනෑ'' එසේ සිතමින් ඔහු කඩමණ්ඩිය අසලට පැමිණියේය. ඔහු කඩමණ්ඩියට යනවිට මුදලාලි ආදාහනයට ගොස් සිටි හෙයින් ඔහුගේ දියණිය වූ කමලා කඩේට පැමිණෙන්නන්ට බඩු දීමට සිටියාය. ඇයද සිරිමල් පාසල් යන විට ඔහුගේම පන්තියේ සිටි එකියකි. සිරිමල් වැඩිහිටි ස්වරූපයක් ආරූඪ කර ගනිමින් ඇය හා කතාවට ගියේය.

'' ඒයි නංගී මේ කඩේ මුදලාලි කවුද?''

'' අප්පච්චි කනත්තට ගියා. තමුන්නැහේ ට මොනවාද උවමනා!'' ඇය විමසුවාය.

'' මටද ඔය තමුන්නැය කිව්වේ?''

'' ඔව් ඇයි?''

'' මේ අපිත් වැදගත් මිනිස්සු! අනික නංගිට මාව පෙනෙන්නේ නාකි මිනිහෙක් වගේ ද?''

'' අනේ මේ ඔය මහත්තයා මගෙන් ඉලපත් පාරක් කන්නෙ නැතිව උවමනා දෙයක් අරන් මෙහෙන් තොලොන්ච් වුණොත් හොඳයි.''

***************

'' අම්මේ කමලාගේ සැර! තව ඩිංගිත්තෙන් ඉලපත් පාරක් තමයි කන්න වෙන්නෙ'' රාස්සිගේ අව්ව වැටෙන යාමේ බංගලාවට ගොඩවෙමින් සිරිමල් තමාටම මුමුණා ගත්තේය.

'' අද රෑට කන්ඩ මොනවත් ඕන නෑ. කඩමණ්ඩියේ දී ආප්පයි වඩෙයි කාලා තේ බිව්වා නේ. දැන් රෑ වෙන්ට කලින් ගෙනාපු බඩු ටික අහුර ගන්ට ඕනෑ'' එසේ සිතූ ඔහු බෑගයේ හා කඩමන්ඩියෙ සිට ගෙන ආ බෑගයේ බඩු සියල්ල පිටතට ගෙන ඒවා පිළිවෙළට තැබුවේය.

පසුදා වේලාසනින් අවදි වුණු ඔහු නගරය බලා පිටත් වූයේ අවශ්‍ය බඩු භාණ්ඩ ගෙන ඒම සඳහායි.

***************

සිරිමල් බංගලාවේ පදිංචියට විත් තෙදිනක් ම ඉක්ම ගොස් හමාරය. ඔහු පෙර දින නගරයට ගොස් ගෙන ආ බඩු භාණ්ඩ ආදිය මනාව අසුරා බංගලාව ඇතුළත මනාව ශුද්ධ පවිත්‍ර කළේය.

උදෑසනින්ම අවදි වූ සිරිමල් උදෑසන ආහාරය සඳහා රොටී පුච්චාගෙන කෑමෙන් අනතුරුව බංගලාව අවට සුද්ද කිරීම ආරම්භ කළේය. ඔහු මුල් දින දෙක තුළදී බංගලාව අවට කැලෑ වැදී තිබූ පෙදෙස් එළි පෙහෙළි කළේය. පසුව ඔහු ඊළඟ සතිය පුරාවටම වෙහෙසී කටයුතු කළේ එළිපෙහෙළි කල භූමිය වගා කිරීමටයි. සිව් මසක් පමණ ගත වී යාමට මත්තෙන් ඔහුට තම මහන්සියේ ප්‍රතිඵල දැකගත හැකි විය. වත්තේ තිබූ කෙසෙල් පඳුරුවල කෙසෙල් ඇවරි දෙකක් බිමට නැමී බර වී තිබෙනු ඔහු දුටුවේය. ඔහු වගා කළ කුඩා කොටුවෙ වම්බටු, දඹළ, මිරිස්, මෑ කරවිල අස්වනු ද නොමදව තිබෙනු ද ඔහු දුටුවේය. මේ සියලු අස්වනු නෙළා කුඩා ගබඩාවේ ගොඩගැසූ ඔහුගේ අදහස වූයේ පසු දිනම නගරයේ පොළට ගොස් විකිණීමටයි.

සිරිමල් දිවා ආහාර වේල සඳහා මඤ්ඤොක්කා ලිපේ තබා කොච්චි සම්බෝලයක් සාදමින් සිටියේය.

එක්වරම කිසිවෙක් බංගලාවේ දොරට තට්ටු කළහ. '' මේ වෙලාවේ කවුද'' සිරිමල් කුතුහලයෙන් යුතුව තමාටම කියා ගත්තේය. '' දැන් වෙස්වලාගත් වෙලාවක් නෑ. මේ ඉන්න විදිහටම ගිහින් බලන්ඩ ඕන. ගමේ මිනිහෙක් නම් මං අවතාරයක් කියලවත් හිතයි නෙව'' එසේ සිතමින් ඔහු දොර විවර කළේය. පැමිණ සිටියේ ඔහු නොදන්නා අමුත්තන් දෙපළකි. එක් අයෙක් තරුණයකු වූ අතර අනෙකා මැදි වියේ පසුවන්නෙකු විය. දෙදෙනා ම වැදගත් උන් ලෙස සිරිමල්ට දිස් විය.

'' සමාවෙන්න අපි ඔබට කරදරයක් වුණා නම්''

'' කාරි නෑ මහත්තයෝ ඇතුලට ඇවිදින් වාඩි වෙලාම කතාබහ කරමුකෝ'' සිරිමල් මැදිවියේ පුද්ගලයාගේ වදනට පැහැදෙමින් ඔවුන්ට ඇරයුම් කළේය. සියල්ලන්ම බංගලාවේ බරාදයට විත් වාඩි වූහ.

'' මම මහාචාර්ය වික්‍රම රණතුංග, මේ මගේ සහයක කෙවින්! එතකොට ඔය ළමයා?''

'' මම සිරිමල්! ඔය මහත්තුරු මොනවද මේ කැලෑවට ඇවිත් කරන්නේ?''

'' අපි ආවේ මේ බංගලාව හොයාගෙන. ඔය ළමයා දන්නෙ නැතිව ඇති මේ බංගලාව ලන්දේසි කාලේ වගේම ඉංග්‍රීසි කාලෙත් භාවිත වුණු හමුදාපතිවරුන්ගේ නිල බංගලාවක් කියලා?''

'' මටත් මේ බංගලාවට ආපු මුල්ම දවසේ ඔහොම දෙයක් හිතුනා මහත්තයෝ! අනික ආතා මට ඒ ගැන කියලා තියෙනවා''

'' ඔය ළමයා ඉස්කෝලේ යන්නේ නැද්ද?''

'' නෑ. මට අප්පච්චි ඉස්කෝලෙ යන්ට දෙන්නේ නෑ. ගිය අවුරුද්දේ තමයි මගේ ඉස්කෝලේ ගමන නැවතුණේ''

'' ඔය ළමයා කීයේ පන්තියට යනකල් ඉගෙන ගත්තාද?''

'' අටේ පන්තියට''

''සර් අපි ආපු කාරණාව කියන්නේ නැතිද?'' මෙතෙක් වේලා නිහඬව සිටි තරුණයා විමසුවේය.

'' හැබෑව, කතාවෙන් කතාවෙන් ඒක මට අමතක උනා! ළමයො ඇත්තටම අපි මේ ගමන ආවේ කැණීම් කටයුතු වගයක් කරන්ට''

'' ඔය මහත්තරුන්ට ඕන කැණීමක් කරගන්ට! මං මගේ වැඩක් බලා ගන්නම්!''

'' ඇත්තටම මොනවද කැලෑවට වෙලා ඔය ළමයා කරන්නේ?'' ඔහුගේ විමසුම නිසා සිරිමල්ට තම උගුරේ යමක් සිර වූවා සේ දැනිණ. ඇත්තම ඔවුනට කිවයුතු යැයි සිරිමල් සිතුවේය. එනිසා කිසිත් නොසඟවා සිදු වූ සියල්ල ඔහු පැවසුවේය.

'' ඔයා ළමයා කැමැති නැද්ද මේ හද්දා පිටිසර ඊටත් කවුරුත් නැති පාළු කැලෑවක ඉන්නවාට වඩා තමුන් වෙනුවෙන් කොළඹ රටට යන්ට?''

'' මයෙ නම් අකමැත්තක් නැහැ මහත්තයා!''

'' අපි දවස් තුනකින් වැඩේ ඉවර කලා, යනකොට අපිත් එක්ක කොළඹ ඔය ළමයාටත් යත හැකියි!''

'' මහත්තයෝ මං හෙට උදෙන්ම එළවළු ටිකක් විකුණන්ට ටවුමට යනවා. මහත්තුරුන්ට පුළුවන් නෙව මේ බංගලාව ඩිංගිත්තක් බලාකියා ගන්ට?''

'' ඔය ළමයා ගිහින් එන්ට''

'' මහත්තුරු දවල්ට සප්පායම් වුනා ද?''

'' නැහැ දරුවෝ!''

'' එහෙනම් මඤ්ඤොක්කායි, කොච්චි සම්බෝලයි කමු''

'' ෂා ඔය ළමයාට උයන්න පිහින්ටත් පුලුවන්ද? එහෙනම් කමු. ඔය වගේ කෑම මේ පළාත්වල මිසක් කොළඹ රට කොයින්ද?''

***************

පසුදා උදෑසනින්ම අවදි වූ සිරිමල් නගරයට පිටත් වීමට සූදානම් වූයේය. ඔහු විශාල බෑගයක් විශාල පොහොර බාගයකුත් පිරෙන්නට එළවළු දමා ගත්තේය.

'' සිරිමල් මල්ලී නම් දැන් නියම සල්ලි කාරයෙක් වගේ '' සිරිමල්ගේ වෙස්වලාගැනීම දුටු තරුණයා පැවසුවේය.

'' පොඩි මහත්තයා මාව දැන් කාටවත් අඳුන ගන්ට බෑ නේද?''

'' ඔව් කාටවත්ම බැරි වෙයි! ඒත් මට ඔය මහත්තයා පට්ටම් උවමනා නෑ. සිරිමල් මට කෙවින් අයියා කියලා කතා කරනවට මං කැමතියි '' ඔහු මිත්‍රශීලීව පැවසුවේය.

'' හොඳයි කෙවින් අයියේ!''

'' මල්ලිට පුළුවන්ද මේ බෑග් දෙකම තනියම උස්සන යන්ට?''

'' වැඩේ නම් ටිකක් අමාරුයි අයියේ! ඒත් මට ඒ දේවල් හොඳට පුරුදුයි. කළුවර වැටෙන්න කලින් එන්ටත් ඕන නිසා මං ගිහින් එන්නම්!''

'' හොඳයි!''

***************

'' සර් මේ බලන්න සිරිමල්ගෙ ඉස්කෝලේ ප්‍රගති වාර්තා පොත!''

'' මිනිහා පොඩි උනාට බොහොම දස්සයෙක් වගේ?'' එදෙස බැලූ වික්‍රම මහතා කීවේය.

'' සර් සිරිමල්ව  කොළඹ එක්ක ගිහින් මොනවද කරන්න යන්නේ?''

'' මං දරුවාට හොඳට උගන්නලා රටට වැඩදායි මිනිහෙක් කරනවා ''

'' මැඩම් නම් සිරිමල්ට ගොඩක් කැමති වෙයි ''

'' ඒක නම් හැබෑව ''

***************

සිරිමල් පොළට ගොස් එළවළු විකිණීමෙන් රුපියල් හත්දාහක මුදලක් ලබා ගත්තේය. ඔහු තමාගේ නිවහන වූ කුඩා පැල්පත පසු කොට හේන අසලින් ගියේය. ඔහු පැමිණෙන විට ඔහුගේ වැඩිමහල් සොහොයුරා හේන කොට මින් සිටියේය. කොළඹ යාමට පෙර ඔහුට පමණක් ඒ බව පැවැසිය යුතුයැයි සිරිමල්ට සිතිණ. එබැවින් ඔහු නිහඬවම හේන වෙත ගියේය. ඔහුගේ සහෝදරයා වැඩපළ නවතා ඔහු දෙස බලා සිටියේය.

'' මහත්තයෝ! මොකක්ද කාරණාව?''

'' අයියේ! සිරිමල් හිස්වැසුම හා අව් කණ්නාඩිය ගලවා ඔහුට ඇමතුවේය.

'' මල්ලියේ උඹ?'' සිරිමල්ගේ සහෝදරයා තමාටම කුනිත්තා ගනිමින් විස්මයෙන් කීවේය.

'' අයියා දෙයියෝ බුදුන් සිහි කරන්ට උවමනා නැහැ. මේක හීනයක් නෙවෙයි ''

'' මල්ලියේ මේ ඇත්තටම උඹ ද?''

'' ඔව් අයියේ, මං සිද්ධ වුණ හැම දේම කියන්නම් '' එසේ පැවසූ සිරිමල් පියා සමඟ වූ අමනාපකමත්, යළිත් ගමට ආ අයුරුත්, බංගලාවේ ජීවත් වන අයුරුත්, කොළඹ යෑමේ අදහසත් පිළිබඳව තම සහෝදරයාට පැහැදිලි කළේය.

'' මල්ලි ආයේ ගෙදර එන්නේ නැතිද?''

'' මං අකාලයේ නොමළොත් ආපිට ගමට එන්නම්. කොහොමත් මේ ගමට මං දැන් මැරිච්ච මිනිහෙක්. ගමේ එකාල මාව දැක්කොතින් හිතාවි මං මළ පෙර්තයෙක් කියලා. හැබැයි අයියා මට එක පොරොන්දුවක් වෙන්ට ඕන ''

'' ඒ මොකක්ද මල්ලි?''

'' අයියා මං ජීවත්වෙලා ඉන්න කාරණාව කාටවත්ම නොකියනවා කියලා මට පොරොන්දු වෙනවා නේද?''

'' හොඳයි මං පොරොන්දු වෙනවා '' මඳක් නිහඬව සිටි ඔහු පැවසුවේය.

'' එහෙනම් අයියේ ඇදිරි වැටෙන්ට කලින් මං ආපිට යන්න ඕනෑ අයියා අම්මාවත්, අප්පච්චිවත්, නංගිවත් බලාගන්න.'' එසේ පවසමින් ඔහු සහෝදරයාගේ අත්ල මත රුපියල් හයදාහක් තැබුවේය.''

'' මල්ලිට කොයින්ද සල්ලි? ''

'' මං බංගලාවේ වත්තේ වගා කරපු එළවළු විකුණලා හම්බ වුණ සල්ලි! එහෙනම් අයියේ මං ගිහින් එන්නම් '' එසේ පැවසූ සිරිමල් තම සහෝදරයාට වැඳ සමුගත්තේය.

## 02.කොළඹ රට

'' ලූකස් ගිහින් අර ගේට්ටුව අරින්න. අන්න ලොකු මහත්තයා ඇවිල්ලා''

වත්තේ මල් පැලවලට සාත්තු කරමින් සිටි ලූකස් ගේට්ටුව වෙත ගියේය. කාරය වත්තට ඇතුළු වී පෝටිකෝව තුළ නතර කෙරිණ.

'' කෙවින් පුතා ඔය පොඩි එකාව ඇහැරවගෙන එක්කන් එන්ට'' එසේ පැවසූ වික්‍රම මහතා නිවස වෙත ගියේ ය.

'' නෝනේ නෝනව පුදුම කරන්ටයි මම දැන් යන්නේ''

'' ඇයි අපේ මහත්තයා මොකක්ද කාරණාව''

'' බලන්නකො මං කාවද එක්ක ආවේ කියලා'' කෙවින් සමග පැමිණි සිරිමල්ව පෙන්වමින් ඔහු පැවසුවේය.

'' කවුද අපේ මහත්තයෝ මේ දරුවා''

'' නෝනේ මේ දරුවාට හොඳටම තෙහෙට්ටු ඇති! පස්සේ නිදහසේ මං කාරණාව පැහැදිලි කරන්නම්කෝ! යමු ඇතුලට''

***************

'' පුතේ ඔය පුතා ගැන අපේ මහත්තයා කාරණා කාරණා මට පැහැදිලි කළා. රෑට ඇතිවෙන්න කෑම කෑවා නේද?'' නිමාලි මහත්මිය කාරුණික ස්වරයෙන් විමසුවාය. සිරිමල් හිස් වනා ඇයට පිළිතුරු දුන්නා ය.

'' එහෙනම් එන්ටකෝ යන්ට පුතාට අපි ලෑස්ති කරපු කාමරේ පෙන්නන්ට'' ඇය සිරිමල්ට ඇරයුම් කළාය. ''සුමනා මේ මහත්තයාගේ බෑග් දෙක කාමරේට ඇරගෙන එන්ට!'' ඒ අතරතුර ඇය නිවසේ සේවිකාවකට ද ඇමතුවාය.

සිරිමලුත් වික්‍රම මහත්මයාගේ බිරිඳත් කාමරය වෙත ගියහ. සිරිමල් කාමරය වටා බැල්මක් හෙළුවේය. එහි නවීන පන්නයේ සුවපහසු ඇඳකුත් අල්මාරියකුත් විය.

'' නෝනා මේ කාමරේ මටමද?'' සිරිමල් විමසුවේය.

'' නැතුව දරුවෝ හැබැයි පුතේ ඔයා මට නෝනා කියලා කතා කරන්ට එපා!''

ඒකනම් ඇත්ත නෝනේ පුතේ ඔයා අපිට ආයේ නැන්දා, මාමා කියලා කතා කරන්ට හොඳද?'' වික්‍රම මහතා ද කතාබහට හවුල් වෙමින් පැවැසුවේය.

'' හොඳයි ''

'' එහෙනම් ඔයා මූණ කට සෝදාගෙන නිදාගන්න. මෙන්න ඔයාගේ බාත්රූම් එක'' වික්‍රම මහතා නානකාමරය පෙන්වමින් පැවසුවේය.

'' එහෙනම් ගුඩ් නයිට්!''

***************

'' සිරිමල් පුතා! ඉක්මනට නැගිටින්න. අපිට උදෙන්ම ගමනක් යන්ට තියෙනවා. මූන කට සෝදන කෑම කන්ට එන්ට. වික්‍රම මහතා පසුවදා උදෑසනින්ම පහත මාලයේ සිට සිරිමල්ට හඬගෑවේය. සිරිමල් ඉක්මනින්ම සූදානම් වී පහත මාලයට අවුත් ඔවුන් හා එක්ව ආහාර ගත්තේය.

'' කොහෙද මාමේ අපි යන්නේ?''

'' මටනම් ඔයාලා එක්ක යන්ට එන්ට වෙන්නේ නෑ. ඒත් ඔයාගේ නැන්දා ඔයාව දැන් ශොපින් එක්කගෙන යයි ''

'' ඒ කිව්වේ!''

''ගිහිල්ලාම බලන්නකෝ! නැන්දා එනකල් ගිහින් කාර් එකට නගින්නකෝ '' සිරිමල් වික්‍රම මහතාගේ නිවේදනයෙන් කාරය වෙත ගියේය. '' පියසිරි එන්ට මං ලෑස්තියි'' වික්‍රම මහතාගේ බිරිඳ වූ නිමාලි කාරයේ රියදුරු වූ පියසිරිට ගමන පිටත්වීමට හඬගෑසුවේය.

සියල්ලෝම අවුත් කාරයට නැග ගමන පිටත් වූහ. කාරයා මඳ දුරක් යන තුරුම සියල්ලන්ම නිහඬතාවයෙන් පසු වූහ. එම නිහඬතාවය මුලින්ම බිඳ දැමුවේ නිමාලි මහත්මියයි.

'' සිරිමල් පුතා ඔයා ඉස්කෝලෙ යන්ට කැමති නැද්ද?''

'' කැමතියි!''

'' එහෙනම් මේ අවුරුද්දෙ පලවෙනි වාරෙම ඔයාට ඉස්කෝලෙ යන්ට පුළුවන්. ඔයා දැන් ඉන්න ඕනේ 10 වසර නේ ?''

'' ඔව් ඒත් මට අවුරුදු දෙකක පාඩම් මගහැරුණු නිසා ඒ පන්තියට යන්න පුළුවන් වෙයිද?''

'' පුතේ ඔයා බයවෙන්න එපා! මං ඔයාට බැරි වෙන පාඩම් කියලා දෙන්නම්. කෙවින් අයියත් ඔයාට උදව් කරයි. මම විශ්‍රාමික විදුහල්පතිනියක් නිසා ඔයාට ඕන උදව්වක් කරන්න මට පුළුවන්. තව දෙයක්, මං හිතනවා ඔයා ඉහළින්ම ශිෂ්‍යත්ව විභාගය පාස් නිසාත්, හොඳ සුදුසුකම් තියෙන නිසාත් මෙහෙ තියෙන හොඳම ඉස්කෝලෙකට ඔයාට යන්ට පුළුවන් වේවි කියලා''

'' ඔය ඇත්තමද?''

'' ඔව් ඔයා දන්නවද මං අද ඔයාට මොනවද අරන් දෙන්නේ කියලා?''

'' නෑ''

'' ඔයාට ඉස්කෝලෙ යන්ට උවමනා දේවල් ගන්ටයි අපි මේ යන්නේ! අනික තව දවස් හතරකින් ඉස්කෝලේ පටන් ගන්නවනෙ''

***************

සිරිමල්ට පාසල් යාමට බඩු භාණ්ඩ මිලදී ගත් ඔවුන් මීළඟට ගියේ අවන්හලක් වෙතයි. සිරිමල්ට මේසයක අසුන් ගැනීමට සලස්වා නිමාලි මහත්මිය ආහාර මිලදී ගැනීමට ගියාය. ඒ අතරවාරයේ කිසිවෙක් නොසිතූ යමක් සිදුවිය. කිසිවකු හෝ සිරිමල්ට පිටුපසින් පැමිණ ඔහුගේ නාසය ලේන්සුවක් තද කරන්නට විය. ඒ සමගම සිරිමල් ගේ ප්‍රාණවත් බව කෙමෙන් ගිලිහී ගොස් ඔහුට දැඩි ක්ලාන්ත ගතියක් දැනෙන්නට විය.

***************

## 03. බයංකර කාලයක්

සිරිමල් අවදි වන විට සිටියේ රයහි මෙන් අඳුරැ ස්ථානයකය. ඔහු පොළොව අතගා බැලුවේ ය. එය තනිකර වැල්ලය. එක්වරම ඔහුට කිසිවෙකුගේ පාදයක් අසුවිය. එය එක්වරම සෙලවෙන්නට විය.

'' ඔය කවුද?'' සිරිමල් විමසුවේය.

'' මම කෙ! කෙවින්'' ඔහු පිළිතුරු දුන්නේය.

'' කෙවින් අයියේ මේ ඔයාද?''

'' ඔව් සිරිමල් මල්ලි! මං ඔයාවබේරගන්ට යනකොට මේ මිනිස්සු මට නින්ද යන බෙහෙත් දාපු ලේන්සුවකින් මගේ නහය තද කරා'' ඒ සමඟ පිටතින් කතා බස් හඩක් ඇසිණ.

''අයියේ ඔයාට ඇහුනද ඒ සද්දෙ මට හිතෙන්නෙ අපි ඉන්නේ ගුහාවක් ඇතුලේ. අපි සද්ද කරන්නේ නැතුව උන්ගේ කතාවට ඇහුම්කන් දෙමු. '' සිරිමල් හඩ පහත් කරමින් කිව්වේය. ඔවුන් එම කතාබහට ඇහුම්කන් දුන්හ.

'' උංගියා අපිට පොලිස් කාරයෝ වෙඩි තියන්ට ගත්තේ නැත්නම් අගේට ගමන පිටත් වෙන්න තිබ්බා. එහෙනම් අපිට මේ කැලෑවල් ගානේ බඩගාන්ට උවමනා වෙන්නෙත් නෑනෙ.''

'' ඒක නෙවෙයි මටනම් හොඳටම බඩගිනියි. ඊයේ දවල්ට කාපු පාර, අපි මොනවද කන්නේ? මේ කන්ද උඩ ගෙයක් දොරක්වත් හොයාගන්ට නෑ. කෑම එකත් කලබලේට වාහනේ දාලා ආවානේ.''

'' ඒයි සමරේ මේ බලපන් මොනවාද අල වර්ගයක්. කන්ට වෙන දෙයක් නැති හින්දා ටිකක් කාලා බලමුද? ඕන තරම් ගම්වල මිනිස්සු අල වර්ග කාල පණ කෙන්ද ගැට ගහගන්නේ. අපි කෑවයි කියල මක් වෙන්ටද?

'' ආ ඉදා ! කාල බලමුකෝ! ''

''  කෑම නම් ඒ තරම්ම නරක නෑ බං!''

***************

'' මල්ලි උන් අර අ ල වගයක් ද කොහෙද කෑවයින් පස්සෙ කිසිම සද්දයක් බද්දයක් නෑනෙ''

'' එහෙනම් අපි ඉක්මනට මේ ගුහාවෙන් එළියට යමු.'' සිරිමල් එසේ කියමින් ගුහාව දිගේ බඩගෑවේය.

'' මල්ලි ඔයාට මොකුත් පේනවද?'' සිරිමල් ගේ පසුපසින් බඩගාමින් කෙවින් විමසුවේය.

'' ම්... ඔව්! ඔව් අයියේ මට පෙනෙනවා. අපි දැන් ළගයි එළියට යන්ට''

'' එහෙනම් ඉක්මනට යමු ''

'' අයියේ මං දැන් එළියට යන්ට යන්නේ. ඔන්න මම බිමට පනිනවා.''

''වැඩිය සද්ද කරන්ට එපා''

'' ඉක්මන් කරන්න අයියේ! උන් පෙනෙන්ට නෑ!'' කෙවින් ද ගුහාවෙන් පිටතට ආවේය. ඔවුන් ගුහාව අවට ඇවිද ගියහ. එක්වරම ඔවුන් බලාපොරොත්තු නොවූ දසුනක් ඔවුන්ගේ නෙතට හසු විය.

'' අයියේ! අයියේ! අර බලන්න. අර මිනිස්සු අතන වැටිලා ඉන්නවා" සිරිමල් නිසලව බිම වැතිර හුන් මිනිසුන් දෙදෙනාව කෙවින් හට පෙන්නු වේය.

'' උන් නිදි ද?'' ඔහු විමසුවේය.

'' මොක වුණත් කමක් නෑ ළඟට ගිහින් බලමු!'' එසේ කියූ සිරිමල් කෙවින් සමගින් එදෙසට ගියේය.

එම මිනිසුන් දෙදෙනාගෙන් එක් අයකු අසාමාන්‍ය ලෙස පසෙකට ඇඹරී වැතිර සිටියේය. අනිකා දෙනෙත්ද විවර කරගෙන වැතිර සිටියේය. ඔවුන් දෙදෙනාගේම මුහුණු වලින් ප්‍රකාශ වුනේ වේදනාකාරී හැඟීමකි.

'' මල්ලි මං නම් හිතන්නෙ නෑ මේ මිනිස්සු තවමත් ජීවතුන් අතර ඇති කියලා''

'' කොහොමත් ඒ ගොල්ලෝ ජීවතුන් අතර ඉන්නවා වෙන්ට බෑ.''

'' ඒ කිව්වේ?'' කෙවින් කුතුහලයෙන් විමසුවේය.

'' මේ ගොල්ලෝ රස කෑමක් කියලා හිතලා ද කොහෙද නියගලා අල කළා.''

'' නියගලා අල ''

'' ඒවා විසයි! ඇයි මේ ගොල්ලෝ කිව්වෙ කෑම ටික වාහනේ දාලා ආපු කතාවක්. මට නම් දැන් හොඳටම බඩගිනි, ඒ මදිවට වතුරත් තිබහයි.''

''මටත්'' කෙවින්ද එය අනුමත කළේය. ''අපි දැන් මොකද කරන්නේ?''

'' අපි පුළුවන් තරම් ඉක්මනින් මෙතනින් පිටත් වෙමු. අපේ ගමේ වෙද ආතා කියලා තියෙන්නේ මළමිනී ළඟ ගොඩක් වෙලා ඉන්ට හොඳ නෑ කියලා.''

'' අපි මේ දෙන්නගේ බෑග් දෙකත් අරගෙන යමු''

'' ඔව් අනිවාර්යෙන්ම ''

***************

'' මොනවා උනත් මල්ලි දෙයියෝ අපිව ගෙනත් ඇරලවලා තියෙන්නේ හරිම ලස්සන කන්දකට. ඒ වුණත් කෑම නැති එක තමයි ප්‍රශ්නේ?''

'' දැන්නම් ඔයාට එහෙම කියන්ට බෑ අයියේ ''

'' ඒ ඇයි?''

'' අර දැක්කද අතන අලකොළ අල පඳුරක් බොහොම සරුවට හැදිලා.'' සිරිමල් ජයග්‍රාහී ලීලාවෙන් පැවසුවේය. '' ඒත් කොහොමද අපි අල හාරගන්නෙ?''

'' ඇයි අර මිනිස්සු ගාව තිබ්බ අත් පොරොව''

'' ඔයා ඒක ගෙනාව ද?''

''ඔව් මල්ලි මං ගෙනාවා''

'' එහෙනම් උත්සහ කරලා බලමු '' සිරිමල් කීවේය.

'' මල්ලිට මහන්සි ඇතිනේ මං ඒ වැඩේ කරන්නම්'' එසේ කියමින් කෙවින් අත්පොරව සිය දෑතට ගෙන අල හැරීමට පටන් ගත්තේය. සිරිමල් ඔහු දෙස මඳ වේලාවක් බලා සිටියේය.

'' අයියට ඔය වැඩ ඒ තරම් හුරු නෑ වගේ ''

'' මං මේ වගේ වැඩක් කරන පළවෙනි වතාව මේ !''

'' මට නම් මේ වගේ දේවල් හොඳට හුරුයි. මං අල ටික හාරන්නම්. ඔයා ඔය බෑග් වල තියෙන්නේ මොනවද කියලා බලන්නකො ''

සිරිමල් අලකොළ අල හාරන අතර වාරයේ කෙවින් රැගෙන ආ බෑගයක් දිග ඇර බලන්නට වූයේය.

'' අයියෙ මොනව ද ඔය බෑග් වල තියෙන්නේ?'' සිරිමල් විමසුවේය.

'' අර මිනිසුන්ගේ ඇඳුම් පැළඳුම් වගේකුයි, ගිනිපෙට්ටි ටිකකුයි, සෝලා ටෝර්ච් එකකුයි, හකුලපු කූඩාරමකුයි, මුට්ටියකුයි, පිඟන් කෝප්ප ටිකකුයි ''

'' වෙලාවට කෑම නැතත් ඒ වගේ දේවල් ටිකක්වත් හම්බ උනේ''

'' අල ගොඩක් තියෙනවද?''

'' අපිට දවස් දෙකක් විතර කන්ට තියෙනවා. දැන් වෙලාව කීයට විතර ඇත්ත ද? සිරිමල් හැරැ වල වසා කෙවින් අසලට අවුත් හිඳ ගනිමින් විමසුවේය.

'' දැන් වෙලාව තුනට කිට්ටුයි. මගේ අතේ ඔරලෝසුවක් තියෙනවා කියලා දැන් තමයි මතක් වුනේ.'' ඔරලෝසුවක් තමන් සතු වීමේසතුටින් කෙවින් කීවේය.

'' මල්ලි අහස දිහා බැලුවහම නම් වැස්සක් ළඟ ළඟම එන පාටයි. අපි ඊට කලින් අද රෑට ඉන්ට තැනක් හොයාගෙන කෑම ටිකක් හදාගමු.''

'' ඔයා කැමති නැතුද අර පුංචි දියපාර ගාව ඉන්ට වතුර තියෙන තැනක ඉන්න එක හොඳයි නේද?''

'' හොදයි එහෙනම් මං ඒ හරියේ කූඩාරම ගහලා හරිගස්සන්නම්. ඔයාට පුලුවන් නේද අලකොල ටික තම්බන්ට මට ඔය උයන පිහන වැඩ බැනේ "

'' අයියෝ ඒක සුළු දෙයක්. හරි අපි වැඩ පටන් ගමු.''

***************

මද වේලාවක් ගතවිය. සිරිමල් දර සොයාවිත් ගල්ගෙඩි තුනකින් ලිපක් සාදා අලකොළ අල තම්බා ගත්තේය. ඉන්පසු සිරිමල් කෙවින් වෙත ගියේ පිඟානක් ඉල්ලා ගැනීමේ අරමුණෙනි.

'' කෙවින් අයියෙ ඔයා නං ඉක්මනට කූඩාරම ගහලා''

'' ඔයා ඇතුලට ඇවිත් බලන්නකෝ '' ඔහු ඇතුලත සිට කීවේය. සිරිමල් කූඩාරම තුළට යන විට කෙවින් විසින් බඩු භාණ්ඩ මනාව අසුරා තිබිණ.

'' කෑම ලෑස්තිද? මටනම් යකෙක් කන්ට බඩගිනි.''

'' ඔව් ලෑස්තියි'' එසේ කියූ සිරිමල් මදක් නිහඬව යමකට කන් දුන්නේය.

'' ඇයි?''

'' ඔයාට ඇහෙනවාද පිනිකුඩු වැටෙනවා! අපි ඉක්මන් කරන්නට ඕනෑ. ඔයා පුළුවන් තරම් දර එකතු කරලා ඇතුලෙන් තියන්ට. නැත්නම් හෙට උදේට බඩගින්නෙ තමයි.'' දෙදෙනාම වහා ක්‍රියාත්මක වූහ. සිරිමල් පිටත වූ සියලු බඩු භාණ්ඩ ඇතුළතින් තබා කෙවින් හා එක්ව දර එකතු කළේය. දර ගොඩ ගැසීම නිමාවීමත් සමග වැසි දරුණු වන්නට වූයේය. ඔවුන්ගේ සිත කිලිපොලමින් හෙණ හඬක් නැගෙන්නට විය.

'' අයියෙ අපි හැමදේටම කලින් කාලා ඉමු. අර පිඟන් ගේනාවද?''

'' ආ මෙන්න'' කෙවින් ඒ වෙත අවුත් සිරිමල්ගෙ අත්ල මත පිඟන් තැබුවේය.

'' හැබැයි කිසිම රසක් නැති අලකොළ අල තමා අපිට කන්ට වෙන්නේ. කොච්චි, ලූණු ඒවා මොකුත් නැහැ'' දෙදෙනාම තරගෙට ආහාරය ගන්නා අතරේ සිරිමල් කීවේය.

'' මල්ලි අපි ඕනවට වැඩිය කන්න හොඳ නෑ. මොකද අපි මේ ඊයෙ උදේට කාපු පාර. ගොඩක් වෙලා බඩගින්නේ ඉඳලා කෑවාහම ගෑස්ට්‍රික් හැදෙනවා '' මද වේලාවකට පසුව කෙවින් කීවේය.

'' ඒ කිව්වේ බඩ පපුවේ දැවිල්ල ගැන ද?''

'' ඔව් '' කෙවින් කූඩාරමෙන් එළියට එබී පිඟාන සෝදමින් කීවේය. සිරිමල් ද ඔහුව අනුගමනය කළේය.

'' අයියෙ මං ඕං කෝප්පවලට වතුර දැම්මා. අරගෙන බොන්ට.''

'' ආ මල්ලිටත්! ඒක නෙමේ අපි දර ටික පැත්තකින් ගොඩ ගහමු නේද?'' තැන තැන විසිරුණ දර කැබැලි පෙන්වමින් කීවේය.

'' ඔව් හොඳයි ''ඔවුන් එක් වී දර ටික කූඩාරමෙන් පසෙකින් ගොඩ ගැසූහ.

'' මල්ලි තව එක වැඩක් තියෙනවා. කූඩාරමේ බිමට එලන්ට පළල කාපට් තුනක් තියෙනවා. ඒ වගේ තමා අපි රෑට නිදියන්නේ. ඒ ටිකත් එළමු.''
ඔහුගේ අදහසට අනුව දෙදෙනාම එක්ව කාපට් දෙකක් ගෙන බිම එළන්නට වූහ.

'' අයියේ මට අදහසක් ආවා. අපිට ඔළුව තියන්ඩ කොට්ට නැති නිසා මේ වැඩි කාපට් එක දෙකට නවලා ඔලුව තියන්ට ගමු.''

'' ඒ අදහස නම් හොඳයි. ඔයාට පුළුවන් නේද ඒක හරිගස්සන්ට. මං පොඩ්ඩක් එලියට ගිහින් එන්නම්.''

'' ඒත් ඔයා නතෙමෙයි නේ?''

'' මට අර මිනිස්සුන්ගේ බෑග් වල තිබිලා කුඩයක් හම්බවුණා''' එසේ කියමින් ඔහු පිටතට ගියේය. සිරිමල් එය මනාව සකස් කොට මදක් එදෙස බලා සිටියේය. ඔහුට පහසු ඇඳුමක් ඇඳ ගැනීමට සිත් විය. ඔහු පාවහන් ගලවා පසෙක තබා බෑගයක වූ  සරමක් ඇඳ ගත්තේය. ඔහුට තම ගම සිහිපත් විය. ඔහු යළිත් වරක් බෑගයක් ගෙන විවර කළේය. එවර  ඔහුට පොරෝනා තුනක් විය. ඒත් සමගම කෙවින් කූඩාරම තුළට ආවේය.

'' ආ මල්ලී ඇඳුම් චේන්ජ් කරගෙන වගේ ෂා බෙඩ්ෂීට් ටිකකුත් හොයාගෙන''

'' අයියේ මට නම් මහන්සි. අනික මගේ පපුවත් දැවිල්ලයි වගේ.

'' අපි ටිකක් නිදා ගමුද?''

'' මටත් පපුව දැවිල්ල වගේ. එහෙනම් ටිකක් නිදා ගමු.''

කෙවින්ද ඇඳුම් පැළඳුම් මාරුකොට සිරිමල් හා එක්ව සුවපහසු සයනෙහි වැතිරුණහ. මොහොතක් ගත වුවද ඔවුන් සොයා නින්ද පැමිණියේ නැත. එක්වරම කෙවින් යළිත් වරක් නැගී සිටියේය.

'' ඇයි අයියේ?'' සිරිමල් විචාලේය.

'' අපිට කූඩාරමේ ෂිපර් එක වහන්ට අමතක වුනානේ. සත්තු රින්ගන්ට පුළුවන්. මං වහලා එන්නම්'' ඔහු එය වසා අවුත් නැවතත් වැතිරුණේ ය.

'' ඉතින් අයියේ මට ඔයා ගැනත් විස්තර ටිකක් කියන්නකො''

'' මම ඉන්නේ ඉස්කෝලේ යන්නේ ඇමරිකන් වල. ඔයා දන්නවාද වික්‍රම අන්කල් කියන්නේ අපේ රටේ හොඳ පිළිගැනීමක් තියෙන පුරාවිද්‍යාඥයෙක්. ඒ වගේම මහාචාර්යවරයෙක්. මගේ අනාගත බලාපොරොත්තුවත් පුරාවිද්‍යාඥයෙක් වෙන එක. ඒ හින්දා තමයි වික්‍රම අන්කල් පරීක්ෂණවලට මාවත් එකතු කර ගත්තේ. ඉතින් මල්ලිගේ අනාගත බලාපොරොත්තුව මොකක්ද?''

'' මං කැමතියි කවදාහරි හොඳ ලේඛකයෙක් වෙන්ට. හරියට මාර්ටින් වික්‍රමසිංහ මහත්තයා වගේ. මම දැනටමත් පොත්දෙකක් ලියල තියෙන්නෙ.''

'' ඔයා ඒවා මුද්‍රණය කරේ නැද්ද?''

'' අපිට ඒවා කරන්ට සල්ලි නැනෙ අයියා. ඒ පොත් දෙක මම කොළඹ ගෙනාවා.''

'' මල්ලි මට පොරොන්දුවක් වෙනවද?''

'' ඒ මොකක්ද?''

'' අපි කවදාහරි ගෙදර ගිය දවසක ඔයා ඔයාගේ ජීවිත කථාවයි, අපි මේ පාළු කැලෑවේදී ලබන අත්දැකීමුයි එකතු කරන් පොතක් ලියන්ට ඕන. එතකොට මමත් ඔයාට පොරොන්දුවක් වෙනවා. මම මගේ වියදමින්ම ඒ පොත මුද්‍රණය කරලා එළිදක්වනවා.''

'' එතකොට අයියේ ඔයාගේ අම්මා තාත්තා?''

'' මගේ මමියි ඩැඩියි ඉන්නේ ඇමරිකන් වල. මමත් මාස ගානකට කලින් ලංකාවට ආවෙ. මගේ ග්‍රැන්මාව බලන්න.''

'' ඉතින් ඔයා ලංකාවේ ඉන්ටමද ආවෙ?''

'' නෑ, මං හරි නම් දැන් ඉන්න ඕන ඇමරිකන් වල.''

'' මං හින්දා තමයි නේද ඔයාටත් මේ කරදරේට ගැවෙන්න වුණේ.''

'' ඒ ගැන හිතන්න එපා. නොලැබෙන දේට වඩා ලැබෙන දේවල් ගැන හිතන්න. ඒක නෙමෙයි අපි නිදිය ගන්ට කියලා නේද මේ හාන්සි වුනේ?'' ඔහු කෙකර සිනහවක් නංවමින් කීවේය.

***************

'' අයියේ එක දිගටම වැහැලා වැහැලා අහසට මහන්සි ද කොහෙද? දවස් ගානක් වැහැලා ඇති, අදවත් මෙහෙම පායාච්චේ.''

'' හාර ගත්තු අලකොළ අල ටිකත් ඉවර වුනා. දවල්ට කන්න දේකුත් නෑ. ඉතින් අපි අද මොකද කරන්නේ?'' කෙවින් විමසුවේය.

'' මට නං හොඳ අදහසක් තියෙනවා. අපි දවස් ගානකින් නා ගත්තෙ නැති නිසා නාන්ට හොඳ තැනක් හොයා ගන්නත් එක්ක අපි මේ ඇල පාර දිගේ ගියොත් මොකද? අපිට ඒ ගමන්ම කෑමට මොනවා හරිත් හොයා ගන්න පුලුවන්.''

'' අදහස නම් හොදයි. එහෙනම් ඔයා ඉන්න. ගමන යන්න උවමනා දේවල් මම අරගෙන එන්නම්.'' ඔහු නොඉවසිල්ලෙන් ඉදිරිපත් වූයේය.

කෙවිනුත් සිරිමලුත් ගමන පිටත් වූයේ මහත් උද්යෝගයෙනි. ඔවුහු දිය පාර දිගේ ගමන් කළහ. උදෑසන අරුණාලෝකයට පිබිදුණු ගහ කොළ වල අසිරියෙන් මත් වූ ඔවුන් වනයේ මිහිරියාව බිඳ දැමීමට වදනකින් හෝ මහ හරස් නොකළහ. නමුත් සිරිමල් එක්වරම ප්‍රීතිඝෝෂා නංවන්නට වූයේය.

'' අයියේ අන්න ඇත ලාවුළු ගහක් තියෙනවා! අර දැක්කද?''

'' අර කහ පාට ගෙඩි තියෙන ගහ ද?'' කිසිදිනක ලාවුළු ගැන නොඇසූ නොදුටු කෙවින් විචාළේය.

'' හරියටම හරි.''

'' ඒත් එතන ටිකක් ඇතයි. මේ පල්ලම බැහැගෙන යන්න වෙයි.''

'' අයියේ මට අදහසක් ආවා. ඔයා නම් මේ වගේ වැඩක් කවදාවත් කරල නැතිව ඇති. ඔයාට පුලුවන් නේද ටිකක් හයිය රිටවල් දෙකක් හොයාගෙන එන්න.'' එසේ පැවසූ සිරිමල් අවටින් කොළපත් දෙකක් සොයා ගත්තේය. කෙවින්ද රිටවල් දෙකක් සොයාගෙන ආවේය.

'' මල්ලි අපි මොකක්ද කරන්න හදන්නේ?''

'' ඔයා මට එක රිටක් දෙන්න. එතකොට මේ කොළපත ඔයා ගන්ට.'' සිරිමල් ඔහුවෙත කොළපතක් පෑවේය.

'' ආ මෙන්න'' කෙවින් එක රිටක් සිරිමල්ට දුන්නේය.

'' දැන් කොළපත බිමින් තියලා මේ විදියට ඒක උඩ ඉඳ ගන්න.'' සිරිමල් කොළපතෙහි හිඳ ගනිමින් පැවසුවේය.

'' හරි ''

'' ඊට පස්සේ මේ රිට මේ විදියට හරහට අත් දෙකෙන් අල්ල ගන්න. මං ඉස්සරෝම රූටන්නම් ඔයා මගේ පිටිපස්සෙන් එන්න. ඔන්න එහෙනම් මම ගියා. නවත්ත ගන්න ඕනේ නම් රිට බිම තියලා කකුල් දෙක නවාගන්න.'' සිරිමල් පැවසුවේය. කෙවින් ද ඔහු අනුගමනය කරමින් ඔහු පසුපසින් ආවේය. අවසන සිරිමල් ලාවුලු ගස අසලට නතර වූයේය. නමුත් එක්වරම ඔවුන් නොසිතූ යමක් සිදුවිය. කෙවින් එක්වරම මහ හඬින් කෑ ගසන්නට වූවේය. ඔහු තම ඔඩොක්කුවේ වූ කොළරොඩු ගසා දැමුවේය.

'' මල්ලි! සර්... සර්පයෙක් '' ඔහු තැති ගෙන සිටියේය. ඔහු සිරිමල් දෙපා අසල නතර වූයේය. සිරිමල් ඔහු දෙස වික්ෂිප්තව බලා උන්නේය. ඔහුගේ දෙපා මත තෙල් කරවලයෙක් වූයේය.

'' අයියේ ඔයා හෙලවෙන්නේ නැතිව ඔහොම ඉන්න.'' එසේ පැවසූ සිරිමල් තම රිට ගෙන විසකුරු සර්පයාව වැටකෙයියා පඳුරක් අසලට විසි කලේය. සිරිමලුත් කෙවිනුත් සැනසුම් සුසුම් හෙළන්නට වූහ.

'' නූලෙන් බේරුණේ. හැබැයි වැඩේ නම් නියමයි.'' කෙවින් සිට ගනිමින් පැවැසුවේය.

'' කොහොමහරි අපි ළඟටම ඇවිල්ලා. අයියා පහල ඉන්න. මම ගහට නගින්නම්.''

'' මම ඔයා කඩන ගෙඩි අහුල ගන්නම්'' සිරිමල් ගසට නගින විට කෙවින් කීවේය.

***************

''  ආ එන්න වික්‍රම මහත්තයා! ඇවිත් වාඩි වෙන්න.'' පොලිස් නිලධාරියා වික්‍රම මහත් මහත්මයාව පිළිගත්තේය. ඉතින් ඕ  අයි  සී මහත්තයෝ දරුවො ගැන ආරංචියක් නැද්ද? දැන් දවස් හතරක් ම ගතවුනා.''

'' කණගාටුයි!  තවම අපිට  ඒ තරම් වැදගත් ආරංචියක් හම්බ වුණේ නෑ. ළමයින්ව පැහැරගෙන ගියපු වාහනේ විතරයි අපිට හම්බ උනේ.''

'' ඕ අයි සී මහත්තයට වැදගත් කාරණාවක් දන්වන්ට තියෙනවා. හැබැයි ඒ කාරණාව මේ ප්‍රශ්නෙට වැදගත් වෙයි ද කියන්න නම් මම දන්නෙ නෑ.''

'' කමක් නෑ කියමු බලන්ට.'' ඔහු පුටුවට හරිබරි ගැහීමින් කීවේය.  වික්‍රම මහතා සිරිමල් පිළිබඳ සියලුම තොරතුරු නොසඟවා පැවසුවේය. පොලිස් නිලධාරියා ඊට ඕනෑකමින් සවන් දී මොහොතක් නිහඬව බලා උන්නේය.

'' ඇත්තටම මේ වගේ දේවල් මේ රටේවෙනවදත් කියල හිතෙනවා මහත්තයෝ.'' ඔහු කීය.

'' ඉතින් ඒ දරුවා කැමැති නැද්ද එයා ජීවත් වෙනවා කියලා පවුලේ අය දැනගන්නවට?''

'' ඇත්තටම නෑ''

'' හොඳයි ඔබතුමාට ගොඩක් ස්තූතියි. සමහරවිට මේ කාරණාව මේ ප්‍රශ්නෙදි ප්‍රයෝජනවත් වෙයි.''

**************

'' ඇති යන්තම් මේ කහ පාට ගෙඩිවත් කන්ට හොයා ගත්තා.''

'' මේ ලාවුළු. ඒක නෙවෙයි අතන නම් නාගන්ට හොඳ තැනක් තියෙනවා. මොකද හිතන්නේ?'' සිරිමල් දියපාර ඇල පහරක් මෙන් පළල් වූ ස්ථානයක් පෙන්වමින් කීවේය.

'' එතන නම් හොඳයි. මං අපිට නාලා අඳින්ට ඇඳුමුත් ගෙනාවා. ඒත් සබන් තමයි නැත්තෙ?''

'' අයියා දන්නවා අපිට සමහර කාල වලට කන්ඩ වත් සල්ලි නෑ. ඉතින් සබන් ගන්නේ කොහොමද?

අපි එතකොට ගොඩපර ගෙඩි තලලා ගාලා නානවා. අපි දැනුත් ඒ දේම කරමු. අර දැක්කද? ගොඩපර ගෙඩි''' සිරිමල් පහතට නැඹුරු වී ගොඩපර අත්තක එල්ලී තිබූ ගොඩපර ගෙඩි වලට පොල්ලක් ගසමින් කීවේය. ගොඩපර පොකුරක්ම දිය පාරට ගිලිහීමට සිරිමල්ගේ පොලු පහර සමත් විය.

'' ඉතින් අපි තවත් බලන් ඉන්නෙ මොකෝ එන්න යමු.'' ඔහු කමිසය ගලවා පසෙකට විසි කරමින් කීවේය. දෙදෙනාම එක්ව දිය පහර වෙත දිවගොස් 'ජබු'' නදින් දියට පැන්නහ. දෙදෙනාම වතුරෙහි පොරබදිමින් මහත් ආස්වාදයක් ලදහ. කිසිදාක මෙවන් අත්දැකීමක් නොලද කෙවින්ද එදින බොහෝ ප්‍රීතිමත් වූයේය. ඔවුන් එකිනෙකාගේ තුළ වූ මිත්‍රත්ව බැඳීම එනිසා තව තවත් වැඩි විය.

**************

හිරු බැස යන සැදෑවේ ඔවුන් කූඩාරම වෙත අවුත් ගිමන් හරින්නට වූහ. සිරිමල් පසෙකට වී නිසොල්මනේ හිඳිනු දුටු කෙවින් ඔහු වෙත සමීප වූයේය.

'' මල්ලි මොකෝ බර කල්පනාවක?''

'' නෑ අයියේ මං මේ කල්පනා කළේ කවදා අපිට මේ කැලෑවෙන් එළියට යන්ට පුළුවන් වෙයිද කියලා?''

'' ඒකනම් ඇත්ත.''

'' දැන් දවස් කීපයක්ම ගත වුණා. අපි හෙට ඉඳලා ආයෙ දිය පාර දිගේ පහලට යමු. අපිට කවදාහරි මනුස්සයෙක්ව හම්බවේවි. ඇවිදින්ට පුළුවන් දුරක් ගිහින් එතන කූඩාරම් ගහමු.''

'' අදහස නම් හොඳයි.'' කෙවින් ද එය අනුමත කළේය.

'' දැන්නම් මගේ තුන් මාසයේ දානෙත් දීලා ඇති නේද?''සිරිමල් සිනාසෙමින් කීවේය.

'' සමහරවිට! අද අපි කලින් කාලා වේලාසනින් නිදාගමු.''

'' අහන්ටකෝ අපි හෙට, අද අපි ආපු තැනට ගිහිල්ලා කොස් ගෙඩියක් කඩන් එමු. ඔයා ඇඳුම් අදින වෙලාවේ මං කැලෑවට ගියානේ. මං දැක්කා කොස් ගහක්. මේ කොස් වාරේ නිසා අනිවාර්යෙන්ම ගෙඩි ඇති.'' සිරිමල් කූඩාරම තුළට යමින් පැවසුවේය.

***************

'' මල්ලි අපි මේ දවස් ටිකට කොච්චර දුරක් ඇවිදින්ට ඇතිද? නරකද පොඩ්ඩක් විවේක ගත්තොත්.'' ත් එසේ පැවැසුවේ දෙසතියක් පමණ ගත වූ පසුවය.

'' අදහස නම් හොඳයි. ඒත් අපි මොකක්ද අද කරන්නේ?''

'' ඔයාම කියන්නකො.''

'' එහෙනම් අපි අද කෑම හොයන්ට යමු. හැබැයි දවල් වෙන්න කලින් එමු, ඒ ඇවිල්ල හම්බවෙන කෑමවලින් මොනවා හරි හදාගමු.''

'' අහන්ට මල්ලි අපිට කරන්න තවත් වැඩක් තියෙනවා. අපි මාළු බාන්ට යමුද?''

'' මං නම් ඔය වගේ වැඩ වලට කැමති නෑ අයියේ.අපේ බඩගින්න නිවාගන්න අපි මොකටද අහිංසක සත්තු මරන්නෙ.''

'' ඔයා කියන දේත් ඇත්ත.''

***************

'' අම්මේ පොඩි නංගි නිදිද?''

''  මෙහාට වරෙන් මා පුතා. ඒකි  නිදි.'' කුඩා දියණිය නලවමින් හුන් ලීලාවතී තම වැඩිමල් පුතාට හඩ ගෑවේය.

'' මේ අද පොළට ගොහින් හම්බවුන සල්ලි. අප්පච්චිට දුන්නොතින් මේ සල්ලි කළුවර වෙන්ට කලියෙන් රා තැබෑරුමට යාවි.''

'' මොකෝ අද උඹ එන්ට රෑ බෝ වුනේ?''

'' මගදී පොලිස් රාලහාමිලා දෙන්නෙක් මුලිච්චි උනානේ.  ඒ මහත්තුරු අතුරුදහන් වෙච්ච කොල්ලෝ දෙන්නෙක්ව හොයනවා. මගෙනුත් විස්තර වගයක් ඇහුව අම්මේ.''

''  හැබෑද? උඹ ගිහිල්ලා මූණ කට සෝදා ගනින්. මං රොටී ගෙඩියක් පුච්චන්නම්කො උඹට කන්ට.''

***************

'' මල්ලි අපි මොනවද මේ කොස් වලින් හදන්නෙ?'' හිරු මුදුන් වන යාමයේ කූඩාරමට පැමිණෙන අතර මග දී එසේ විමසුවේ කෙවින්ය.

'' අපිට හදන්න පුළුවන්නේ එක දෙයයි. අපිකොස් තම්බලා කමු. කොස්ඇට පුච්චලා කමු.

'' දැන් අපි ගාව ගිනිපෙට්ටි කොච්චර තියෙනවද?''

'' දුසිමකට වඩා තියෙනවා මයෙ හිතේ. දවසකටම කෑම එකපාරම උයන නිසා එච්චර ගිනිකූරු අපතේ යන්නෙ නෑ.''

'' ඒක හොඳයි.''

ඔවුන් මද දුරක් නිහඬව කූඩාරම් වෙත පියමන් කළහ. ගම්මානයේදී අක්කුං ආතා කියූ යමක් එක්වර ම සිරිමල්ට සිහිපත් විය. ඒ රාස්සිගේ අච්ච ගැන කියූ කතාවයි. ඔහුගේ මනසෙහි රාස්සි හොල්මන් කරන්නට වූයේය.

'' සිරිමල් කොලුවෝ උඹ දන්නවාද හිරු දෙයියො බහින මේ වගේ වෙලාවට වැටෙන එළියට ඉස්සර ගම්මු කිව්වේ රාස්සිගේ අච්ච කියලා. මේ වෙලාවට උන්දෑ හාල් පොලනවලු. කොණ්ඩෙ වේලනවලු එක දෙයක් නෙමෙයි.

'' ඉතින් ආතේ ඇයි රාස්සි මේ වගේ වෙලාවට ඒ වැඩ කරන්නේ. උන්දැ දවල්ට නිදියනවද?''

'' රාස්සි කියන්නෙ නිකං නෙමෙයිනේ පුතේ උන්දැට. උන්දෑ එළියට පහලියට එන්නේ අඳුර වැටීගෙන එන වෙලාවට.

'' ඉතින් දවල්ට රාස්සි කොහෙද ඉන්නේ?''

'' උන්දෑ ඉන්නෙ බැද්දේ. ඒ කියන්නේ ඝන කැලෑවල. ඒකයි උඹලට කැලෑ ගානේ කරක් ගහන්න එපා කියන්නේ.''

**************

සිරිමල් මනසින් ගම්මානේ සැරිසරන්නට වූයේය. එක්වරම රාස්සිගේ කතිකාව සැබෑවක් යැයි හඟවන්නට මෙන් අවටින් නාදයක් ඇසිණ. සිරිමලුත් කෙවින් උමතු වූවන් සේ ගල් ගැසී මුහුණින් මුහුණ බලා ගන්නට වූහ. එය ඔවුන් හඹා එන්නාක් මෙන් නාදය තව තවත් සමීප වී ඇසෙන්නට විය. සිරිමල් නිසලව පසුපස හැරී බලන්නට වූයේ ය. ඔහු එම දර්ශනය දැකීමෙන් බිරන්ත වූයේය.

'' කෙවින් අයියේ, අපි ඉක්මනට මෙතනින් යමු.''

'' ඇයි මොකෙක්ද?''

'' දිවියෙක්, හඳුන් දිවියෙක් පස්ස නොබලා දුවමු.'' ඔවූහු ලඳු කැලය මැදින් දිව ගියහ. වරෙක නැවතී හතිලමින් ද වරෙක වැටි වැටි දුවමින් ඔවුන් දිවියා හා පොර බැඳුනහ.

'' අයියේ ඉක්මන් කරමු තව පොඩ්ඩ දුරයි. ඌ අපිව අතාරින්නේ නැති පාටයි.''

වැඩි වෙලා යන්ට මත්තෙන් ඔවුන් කූඩාරම් භූමියට පැමිණියහ. ඔවූහු කූඩාරම් තුළට ගියහ.

'' අයියේ ඔය ෂිපර් එක වහන්න. ඌ ටික වෙලාවක් යනකල් මේ හරියේ ගැවසෙයි. එතකල් අපි ඇතුළට වෙලා ඉමු.''

***************

'' හිරු අවරගිරට පා තබමින් අඳුර හා සටන් වදින්නට විය. අවටින් රැහැයියන්ගේ චිරි චිරියාව කන්දොස්කිරියාවක් වන තරමට සිරිමල්ගෙත් කෙවින්ගෙත් නින්දට බාධා කරන්නට වූයේය.

'' අයියේ ඔයා නිදිද?'' සිරිමල් විමසුවේය.

'' නෑ. අද සිද්ද වෙච්ච දේ මතක් වෙනකොට මට නින්ද යන්නෙ නැහැ.''

'' මොනවා උනත් අපි බේරුණු එක ගැන සතුටු වෙන්න ඕනේ.''

'' අපි මෙ කැලෑවට ඇවිත් කොච්චර විතර කාලයක් වෙනවද?''

'' දැන් අවුරුද්දකට කිට්ටු ඇති මල්ලි.''

'' මොනවා උනත් අයියේ ඉස්සරහට අපිට මේ වගේ කොච්චර කරදර වලට මුහුණ දෙන්න වෙයිද දන්නේ නෑ. ඒ හින්දා පුළුවන් ඉක්මනට මේ කැලෑවෙන් එලියට යමු.''

'' ඔයාට හිතෙන්නේ නැද්ද අපි එක තැන කැරකෙනවා කියලා.''

'' සමහරවිට ඒක ඇත්ත වෙන්ටත් පුළුවන්. ඇයි ඉතින් අපි ඉස්සර වගේ දිය පාරේ දිගේ යන්නේ නැත්තෙ.

අනික දිය පාර එන්න එන්නම පළල් වෙනවා. මට හොඳටම විශ්වාසයි දිය පාර දිගේ ගියොත් අපිට මිනිස්සු ඉන්න පැත්තට යාගන්න පුළුවන් වෙයි.''

'' එහෙනම් අපි හෙට උදේම කූඩාරම අකුලන් ගමන පිටත් වෙමු. එහෙම නේද?'' කෙවින් විමසුවේය.

'' ග්ර්ර්, නමුත් ඔහුගේ ප්‍රශ්නෙට පිළිතුරක් ලෙස ලැබුණේ සිරිමල්ට ගෙරවුම් හඬකි.

***************

පසුදා වේලපහින් අවදි වූ ඔහු කූඩාරම හකුලා දිය පහර දිගේ ගමන් කරන්නට වූහ. හුදකලා වන ලැහැබේ වශීකෘත සංගීතයට කන්යොමමින් නෙතට රසදුනක්ම වූ මීදුම් සළු පට අතරින් විහිදුණු උදා හිරු රැසින් උන්මාද වෙමින් ඔවුහු ගමනෙහි යෙදුණහ.

'' මල්ලි අපි ටිකක් නතර වෙලා යමු ද? බෑග් එකේ බර නිසා මගේ කොන්ද කැඩෙන්න වගේ.''

'' එහෙනම් අර උණ පඳුර ගාව ටිකක් නැවතිලා යමු.'' දෙදෙනාම අසල වූ උණ පඳුර අසල නැවතී විවේක ගත්හ.

'' අයියේ මං ඉක්මනට ගමනක් ගිහින් එන්නම්. ඔයා ඔතනම ඉන්ට.''

'' එහෙනම් ඉක්මනට එන්ට.''

***************

මද වේලාවකට පසු ඔහු යළිත් කෙවින් වෙත ආවේය.

'' මල්ලි කොහෙද ගියේ?'' කෙවින් විමසුවේය.

'' අයියේ අපිට කරන්ට අලුත් වැඩක් තියෙනවා. ඔයා දැක්කද මෙහාට දියපාර හුඟක් සැරයි. ඒ වගේම ගැඹුරුයි.

අපිට පහුරක් හදා ගත්තොත් ගමන ඉක්මන් කරගන්න පුලුවන් වෙයි. පහුරකට යන්න පුළුවන් තරම් දියපාර දැන් පළලයි නේ.''

'' ඒත් අපි කොහොමද පහුරක් හදාගන්නේ?''

'' අපි මේ උණ පදුරෙන් උණ බට ටිකක් කපා ගමු. හැබැයි ඊට කලින් තිත්ත වැල් ටිකක් හොයාගමු. අපි වැඩ බෙදාගෙන කළොත් අපිට ඉක්මනට හවස් වෙන්න කලින් පහුර හදාගන්න පුළුවන් වෙයි.''

'' මං මොනවද කරන්න ඕනෑ.''

'' ඔයා දැක්කද අර එල්ලෙන වැල් ඒව තමයි තිත්ත වැල්. ඔයා අර මන්නා පිහිය අරගෙන ටිකක් හයිය තිත්තවැල් දෙකක් තුනක් කපන් අරන් එන්නකෝ. සිරිමල් කීවේය. ''මං උණ ගස් දෙකකුත් බාන්නම්.

හෝරා දෙක තුනකට පහුර සෑදීම සඳහා සියල්ල සූදානම් විය. සිරිමල් උසින් සමාන උණ බට කිහිපයක් ගෙන ඔවුන්ට සෑහෙන තරම් පළල ඒවා එකිනෙකට වැල් වලින් ගැට ගසා සාදා ගත්තේය. පහර රිටි ගෑම සඳහා දිග උණ බට යුගලක් ද ඔහු කපා ගත්තේය.

'' පහුරේ වැඩ ටික නම් ඉවරයි නේද මල්ලි?'' කෙවින් විමසුවේය.

'' අපි අර පහුර උඩ කූඩාරම අටවමු. එතකොට තමයි වැඩේ ඉවර වෙන්නෙ.''

'' එහෙනම් ඒ වැඩේ මං කරන්නම්. ඔයා මෙච්චර වෙලා මහන්සි උනානේ.

'' මහන්සිය බලලා බෑ අයියේ. එහෙනම් ඔයා ඒ වැඩේ කරන්න. මං අපිට කන්ට කෑම මොනවා හරි හොයාන එන්නම්.''

'' පරිස්සමින් මල්ලි.'' කෙවින් ඔහුට අවවාද කළේය.

***************

මොහොතක් ගත විය. සිරිමල් වනයට ගොස් පහුරේ ගමනට අවශ්‍ය ආහාර සොයා ගත්තේය. සිරිමල් කෙවින් වෙත පැමිණෙන විට ඔහු සියල්ල සූදානම් කොට තිබුණේය.

'' මල්ලි මොනවද අපිට කන්ට හොයාගත්තෙ?''

'' අපේ ගමනට ඕන තරම් කෑම මං හොයා ගත්තා. අරැක්කා අල, බුත්වැලි ආතා, දඹ, පැණි වරකා වගේ ගොඩක් කෑම මට හම්බ වුණා. අපි ගමන පටන් ගන්ට කලින් මොනවා හරි කාල ඉමු.''

'' ෂා අපි අදම ගමන පටන් ගන්නවද? ඒක නම් නියමයි. එහෙනම් අපි මොනවා හරි කාලා ඉමු.'' කෙවින් ප්‍රීතියෙන් ඉපිලෙමින් පැවසුවේය.

***************

## 04.පහුරකින් ගමනක්

දෙදෙනාම ඔවුන්ට සිත් සේ ආහාර ගෙන ගමන සඳහා සූදානම් වූහ. හිරු බැස යමින් තිබූ සැදෑවේ හිරු කිරණින් වෙලෙමින් ඔවුහු පහුර විසල් වූ දිය පහර වෙත අදින්නට වූහ. මොහොතක් වෙහෙසෙමින් ඔහුන් කෙසේ හෝ දිය පහර වෙත පහුර ගෙන ගියහ. පහුර දියට පනින ජබුං හඬින් බියපත් වූ ඉබ්බකු තම කටුව තුළට අතපය ඔබා ගත්තේ සිරිමල්ට හා කෙවින්ට නෝක්කාඩු බැල්මක් හෙළමිනි. එය ගණනකට නොගත් ඔවුන් පහුර වෙත පැන්නෙ ජයඝෝෂා නංවමිනි.

'' අයියේ මේ මොන මාසෙද?'' සිරිමල් එක්වරම විමසුවේය.

'' මේ දෙසැම්බර් මාසේ.'' කෙවින් පිළිතුරු දුන්නේ ය. '' ඇයි මල්ලි එහෙම ඇහුවේ?''

'' නෑ නිකං. අපි මොකෝ මේ බලන් ඉන්නේ? ගමන පිටත් වෙමු.''

'' නෑ මල්ලි, අපිට තව එක දෙයක් අමතක උනා. ඕනෑම ගමනක් පිටත් වෙන්න කලින් අපි පන්සිල් අරන් ගමන පිටත් වෙන්ඩ ඕනේ. ඒක අපේ ආරක්ෂාවට හොඳයි. එහෙම නේද?''

''ඔව් අයියේ ''

සිරිමලුත් කෙවිනුත් පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව තරගෙට මෙන් රිටි ගාමින් පහුර පදින්නට වූහ. හෝරා දෙකක් පමණක් ඔවුන් නිහඬව රිටි ගාන්නට වූහ. ඔවුන්ට නොදැනීම අඳුර වැටි නොමේරූ චන්ද්‍රයා නැගෙනහිර අහස දීප්තිමත් කරන්නට විය.

'' අයියේ මේ අදට ඇති. අපි ගිහින් නිදාගමු.''

'' අදහස නම් හොඳයි. අපි මුකුත් කනවද? මටනම් බඩගිනි නෑ.

'' එහෙනම් මෙහෙමම නිදාගමු. මටත් බඩගිනි නෑ. අහන්ට අපි හෙට උදෙන්ම නැගිටලා ඉර මුදුන් වෙනකල් පහුර රිටි ගාමු. අව්ව සැර අඩු වෙනකම් ඊට පස්සේ විවේක ගමු. ආයේ හවස් උනාම රිටි ගාමු.''

'' අදහස නම් හොඳයි. එතකොට අපිට අව්වෙ කර වෙන්නෙත් නැහැ.'' කෙවින් කීය.

'' එහෙනම් අපි කූඩාරම ඇතුලට යමු. මං පහුර ගැටගහලා එන්නම්.''

***************

දිනෙන් දින සිරිමල්ගෙත්, කෙවින්ගෙත් බලාපොරොත්තු කඩකරමින් පහුරේ ගමන දීර්ඝ විය.

'' මල්ලි දැන් වතුර පාර සැර වැඩි වේගෙන එනවා නේද?'' සතියකට පමණ පසුව කෙවින් විමසුවේය.

'' අපි මේ කන්දේ බෑවුම හරියේ වගේ ඉන්නෙ. ඒකයි වතුර පාර මේ තරම් සැර. අපිට ඕනේ නම් රිටි ගාන්නේ නැතිව උනත් යන්න පුළුවන්. සිරිමල් රිටි ගෑම නවතා පහුරේ දිගා වෙමින් පැවසුවේය.

'' ඒත් මට හිතාගන්න බැරි දෙයක් තියෙනවා. අපිව පැහැර ගත්ත මිනිස්සු කොහොමද එක දවසකින් මේ කන්ද නැග්ගේ?''

'' මං හිතන්නේ මේ අය මේ කැලෑව ගැනයි., කන්ද ගැනයි හොඳටම දන්න අය.''

'' ඒත් මල්ලි ඒ අය කවුරු වෙන්න පුළුවන්ද?''

'' සමහරවිට නිධන් හොරු වෙන්ට  බැරිද? එහෙම නැත්තං ගස් කපලා ජාවාරම් කරන කට්ටිය.''

'' වෙන්ට පුළුවන්.''

'' අයියේ මට තව දෙයක් හිතෙනවා. ඒ මිනිස්සු මොකක් හරි කෙටි පාරක් දන්නවා වෙන්න බැරිද?''

'' එහෙම වෙන්නත් පුළුවන්. එයාලා වාහනේකින් ආපු කතාවක් නේද කිව්වේ? ඒක මග දාලා ආවලු පොලිසිය වෙඩි තිබ්බ නිසා. ඒත් අපි දවස් කීයක් සිහි නැති කරලා හිටිය ද දන්නෙ නෑ.''

'' අපි දවසකට වඩා සිහි නැතුව හිටියා වෙන්ට බෑ''

'' ඔව්, එහෙනම් එදා අපිට නැගිට ගන්නවත් වෙන්නේ නෑ.'' කෙවින් කීවේය.

## 05. හුදෙකලාවක අවසානය

‘‘අයියේ ඉක්මන් කරලා නැගිටින්න.‘‘ එක් දිනක් උදෑසන සිරිමල් ප්‍රීතිමත් දර්ශනයක් දුටුවේය. සිරිමල්ගේ හඬින් කෙවින් විමතියෙන් මෙන් අවදි වුණේය.

’’ ඇයි මල්ලි!’’

’’ අයියේ අර බලන්න දුමක්! දුමක් පිට වෙනවා. ඒ කියන්නේ මිනිස්සු!’’ සිරිමල්ගෙ වදනින් කෙවින් ද උමතු වූ අයුරින් උඩ පනින්නට වූයේය. ඔහුගේ උඩ පැනීම නිසා පහුර ද ඒ මේ අත නැටවෙන්නට විය. පහුර කඩිමුඩියේ ඉවුරෙහි වූ ගසක ගැට ගසමින් ඔවුන් දුම් වළලු නැගෙන දෙසට ගියහ.

’’ අපිව දකින මිනිස්සු හිතයිද දන්නේ නෑ අපි ටවුමෙ වැද්දෝ කියලා.’’ කෙවින් තමා දෙස හා සිරිමල් දෙස බලමින් කීවේය.

’’ අයියේ අර.’’ සිරිමල් ගමන නවත්තමින් ඉදිරියෙහි වූ පිදුරු සෙවිළි කළ කුඩා නිවසක් පෙන්නුවේය. නිවසෙහි වූ මහලු ගැහැනියක් වී තම්බමින් සිටියේය. සිරිමල් උගුර පාදා ඇයට ඇසෙන ලෙස ශබ්දයක් කළේය. බියට පත්වූ ඇය ගැස්සී උඩ බිම බැලුවා ය.

’’ ආච්චි බයවෙන්ට එපා. අපි අර කැලෑවෙ අතරමං වුන දෙන්නෙක්. අපිට උදව්වක් කරන්න පුළුවන්ද” සිරිමල් විමසුවේය.

’’ මට පුළුවන් උදව්වක් මං ඔය දරුවන්ට කරන්නම්, මොකක්ද කාරණාව?’’ ඇය කාරුණිකව විමසුවේය.’’

’’ අපිට ටෙලිෆෝන් කෝල් එකක් ගන්න පුළුවන් වෙයිද?’’

’’ මේන් මෙහෙන් මහත්තුරු වාඩිවෙන්ටකෝ.’’ ඇය කුඩා බංකුවක් ඔවුන්ට පෑවේය. ’’ මයෙ පුතා! අපේ මහත්තයා මෙහෙට ඩිංගිත්තක් ආවනම්.’’

'' ඇයි අම්මා?'' ඇයගේ විධානයෙන් මහලු මිනිසකු හා හැඩිදැඩි තරුණයෙකු කුඩා පැල්පතින් පිටතට ආහ.

'' මේ මහත්වරුන්ට අපෙන් උපකාරයක් උවමනා ලු.'' මැහැල්ල ඔවුන් හට කීවාය.

'' මොකක්ද මහත්තයෝ කෙරෙන්ට උවමනා?'' තරුණයා කෙවින්ගෙන් හා සිරිමල්ගෙන් විමසුවේය. සිරිමල් සිදු වූ සියල්ල ඔවුන් හට පැවසුවේය.

'' මේ පළාතේ ටෙලිපෝන් කෝල් ගන්ට පුළුවන්නේ ඉස්කෝලේ මහත්තයාගේ ගෙදරින් තමා.'' මහල්ලා කීවේය.

'' ඔය මහත්තුරුන්ට මහන්සිත් ඇතිනේ. අපි ගොහින් ඉස්කෝලේ මහත්තයාලගේ ගෙදරින් ටෙලිපෝන් කෝල් එකක් ඇන්න එන්නම්'' තරුණයා කීවේය.

'' නෝනේ එතකම් මේ මහත්තුරුන්ට කන්න මොනව හරි සූදානම් කරා නම්.''

***************

'' මේ මහත්තුරු නම් හුඟක් හාමත් වෙලා වගේ ඉඳලා තියෙන්නෙ.'' මැහැල්ල පැවසුවේ පිඟානෙහි වූ කුරහන් රොටි අතුරුදහන් වන අයුරු දෙස බලමිනි.

'' ඔව් ආච්චි, අපිව පැහැරගත්තායින් පස්සෙ අපි මේ කටට රහට කෑමක් කනවාමයි.'' සිරිමල් රොටි කැබැල්ලක් ගිල දමමින් කීවේය.

'' අන්න ඉස්කෝලේ මහත්තයයි, පොලිසියේ මහත්වරුයි එනවා.'' ඈතින් පෙනෙන ගුරු පාර දිගේ ඇදෙන රිය පෙලහර දෙස නෙත් හෙලමින් ඇය පැවැසුවාය.

'' ඒක නෙවෙයි ආච්චි අර කන්දට යන්න පුළුවන් කෙටි පාරක් එහෙම තියෙනවද?'' කෙවින් විමසුවේය.

'' මොකද නැත්තෙ, ඔය කන්ද එහා පැත්තේ පාරක් තියෙනවා. තව නිධන් හොරුයි, ජාවාරම් කාරයෝ යන එන හොර පාරවල් දෙක තුනකුත් තියෙනවයි කියල වංගියක් ගමේ එවුන් කතා වෙනවා ඇහුණා.'' ඇයගේ පිළිතුරත් සමග කුඩා පැල්පත අසල යතුරු පැදියකුත්, පොලිස් ජීප් රියකුත් නතර වන්නට විය.

***************

'' නිවසේ දුරකතනය නාද විය. නිවසෙහි වැඩකටයුතු කිරීමට සිටින සුමනා ඒ වෙත දිව ගියාය.

'' හෙලෝ ''

'' හෙලෝ '' මේ පොලීසියෙන්! වික්‍රම මහත්තයා ඉන්නවාද?

'' වික්‍රම මහත්තයා කන්තෝරුවට ගියා. තව ටිකකින් එයි.''

'' එහෙනම් මහත්තයට කියන්න මේ දැන්මම පොලීසියට එන්න කියලා.''

'' ඇයි මහත්තයෝ හදිස්සියක්ද?''

'' අපිට ළමයි දෙන්නව හම්බවුණා.''

'' හොඳයි මහත්තයෝ මං කාරණාව කියන්නම්.'' ඇය රිසීවරය තබත්ම නිවසේ පෝටිකෝවට කාරයක් ඇතුළු විය.

'' මහත්තයෝ මේ දැන් මහත්තයට කෝල් එකක් ආවා.''

'' කවුද සුමනා?'' කාරයෙන් බසිමින් වික්‍රම මහතා විමසුවේය.

'' පොලීසියෙන්! සිරිමල් මහත්තයාවයි, කෙවින් මහත්තයාවයි හොයාගෙන. දැන්මම පොලිසියට එන්න කිව්වා.''

''මොකක් ? හරි මං දැන්මම යනවා. පියසිරිට කියන්ට නිමාලිවත් එක්කන පොලිසියට එන්ට කියලා.''

***************

'' පුතා තව ටිකක් බෙදාගෙන කන්න.'' නිමාලි මහත්මිය කීවාය.

'' ඇති නැන්දේ මගෙ බඩ හොඳටම පිරිලා.''

'' ඔව් ඔව්! කැලෑවේදී ඒ තරම් කෑමත් කන්න නැතිව ඇති. පේන්නෑ මේ ගෙවුනු කාලෙට ගොඩක් වෙනස්වෙලා. ඇත්තට මොනවාද පුතාලා එහිදී කෑවේ බීවේ?'' වික්‍රම මහතාද ඔවුන්ගේ කතාබහට හවුල් වෙමින් විමසුවේය.

'' පලතුරුයි, අල වර්ගයි තමයි.'' සිරිමල් කෙසෙල් ගෙඩියක් කමින් කීවේය.

'' අපි පුතාව සදුදා ඉදලා ඉස්කෝලේ යවනව. හැබැයි ඔක්කොටම කලින් ඔයාගේ කොණ්ඩෙ කපන්න ඕන. හරියට නිකම් කැලෑවෙන් ආපු රිලා පැටියෙක් වගේ.'' නිමාලි මහත්මිය සිරිමල්ගේ උරහිස දක්වා වැවී තිබූ හිසකෙස් පිරිමදිමින් කීවාය.

'' දැන් ගිහින් මූන හෝදන් නිදා ගන්න.'' ඇය කීවාය.

***************

දෙදිනක් ගත විය.

'' පුතා දන්නවාද වැඩක් ''

'' මොකක්ද මාමේ?''

'' අර පුතාලාව පැහැර ගත්තු මැරිච්ච උන් දෙන්නගෙ මරණ පරීක්ෂණ කරන්ට පොලීසියෙන් කණ්ඩායමක් ගිහිල්ලා.''

'' එහෙමද?'' ඒත් සමගම නිවසේ විදුලි සීනුව නාද විය. වික්‍රම මහතා ඒ වෙත ගියේය.

'' ආ මේ කෙවින්නේ! එන්න ඇතුලට.'' සියල්ලෝම ආලින්දයේ අසුන් ගත්හ.

'' ඉතින් පුතා මොකෝ මේ පැත්තේ? මල්ලිව හම්බ වෙන්ටද?''

''සර් මං අද හවස ඇමරිකාවට යනවා.''

'' අනේ පුතේ කලින් කිව්වා නම් කෑම මොනවා හරිත් ලෑස්ති කරන්න තිබ්බා. කීයටද ෆ්ලයිට් එක?''

'' හවස හයට'' කෙවින් පිළිතුරු දුන්නේ ය.

'' එහෙනම් පුතාලා කතා කරන්නකෝ. මං ඔයාලට බොන්ට මොනවා හරි ලෑස්ති කරන්නම්.'' එසේ කියූ ඔහු මුළුතැන්ගෙය වෙත ගියේය.

'' ඉතින් මල්ලි ඔයා පොත ලියන්න පටන් ගත්තාද?''

'' ඔව් ''

'' ඔයා හෙට ඉස්කෝලෙට යනවා නේද?''

'' ඔව් ''

'' මොකෝ අද ඔච්චර කෙටියෙන් උත්තර දෙන්නෙ. මයෙත් එක්ක තරහින් වගේ?''

'' අයියා ආයෙ කවද්ද ලංකාවට එන්නේ?'' සිරිමල් විමසුවේය.

'' ඒකයි මේ කාරණාව. එහෙම දවසක් නෑ මල්ලි. ඔයාට ඕන වෙලාවක සර්ගෙ ෆෝන් එකෙන් කෝල් කරන්න. ඔයාට පුලුවන් මට ලියුම් ලියන්න. හැබැයි මට ඔයා එක්ක ගත කරපු කාලය කවදාවත් අමතක වෙන්නේ නැහැ.''

'' මටත් එහෙමයි.''

'' ඔයා හොඳට මහන්සි වෙලා පාඩම් වැඩ කරන්න. එතකොට ඔයාගේ හීන හැබෑ කරගන්න පුලුවන් වෙයි.''

***************

අවටින් නැගෙන හිකි හිකියට බැනවදිමින් හුන් සිසුවෙක් කොරිඩෝව දිගේ පැමිණෙන අමුත්තන් දෙස ඇස් දල්වා බලා උන්නේය.

'' නිමාලි ටීචර්!'' එසේ කියමින් ඔහු නිමාලි මහත්මියට දණගසා වැන්දේය.

'' එතකොට මේ මහාචාර්ය වික්‍රම නේද?''

'' ඔව් පුතා!''

'' මගෙන් මොකවත් උදව්වක් එහෙම ඕනෙද?'' සිසුවා විමසුවේය.

'' අපිව 11-B පන්තිය ගාවට එක්කන යන්ට පුළුවන්ද?''

'' පුළුවන් ටීචර්, එන්න මාත් එක්ක.'' එසේ පැවසූ ඔහු සිරිමල් වෙත සමීප වූයේය.

'' මොකක්ද මල්ලි නම?''

'' සිරිමල් ''

'' මම තිවංක. අපේ ඉස්කෝලේ හෙඩ් ප්‍රිපෙක්ට්'' ඔහු තමාව හඳුන්වා දුන්නේය. ''මල්ලි මේ ඉස්කෝලෙට එන්න හිටියේ ගිය අවුරුද්දේ නේද?''

'' ඔව්, අයියේ කොහොමද ඒක දන්නේ?''

'' ඔයා කෙවින්ව දන්නවා නේද? එයා රට යන්ට කලින් මේ ඉස්කෝලෙට ආවෙ. එයා මගේ හොඳම යාළුවා. එයා තමයි මට ඔයා ගැන කිව්වේ.''

'' ඔව් මං ගිය අවුරුද්දේ තමයි එන්න හිටියේ. ඒත් මාවයි කෙවින් අයියාවයි මිනිස්සු කට්ටියක් පැහැර ගත්තා.''

'' ඒ කියන්නේ කෙවින් එක්ක පැහැරගත් අනිත් ළමයා ඔයා නේද?''

'' ඔව් ඒ මං තමයි.''

'' කෙවින් මේ  ඉස්කෝලෙ හිටපු ප්‍රසිද්ධ ළමයෙක්. ඒ නිසා මේ ඉස්කෝලේ හැමෝම මේ දවස් වල කතා වෙන්නේ ඒ ගැන. ඕ කතාවෙන් කතාවෙන් අපි පන්තිය ළඟටම ආවා.'' එසේ කියූ ඔහු පන්ති කාමරයට ඇතුළු වූයේය.

'' එක්ස් කියුස් මී ටීචර්!'' පන්තියට උගන්වමින් හුන් ගුරුවරිය ඔහු වෙත ආවේය.

'' ආහ් මිස්ට වික්‍රම, එතකොට නිමාලි ටීචර්! එතකොට මෙයා වෙන්ට ඇති අලුතින් එනවයි කිව්ව දරුවා. පුතාලා බේරුණු එක ගැන මට සතුටුයි. පස්සේ මට සිද්ධ වෙච්ච දේවල් කියන්ටකෝ. පුතා ගිහින් අන්න අතනින් වාඩිවෙන්ට.'' ගුරුතුමිය කීවාය. සිරිමල් පන්තියට ඇතුල් වෙත්ම පන්තියේ ළමුන් මුහුණෙන් මුහුණ බලමින් රහස් කියන්නට වූහ.

***************

එක් දිනක් සිරිමල් විවේක කාලයේ දී පාසලේ එළිමහන් බංකුවක වාඩි වී නිහඬව බලා උන්නේය.

'' ඒයි ඒයි තමුසෙ නේද අපේ පන්තියට අලුතෙන් ආපු එකා?'' එතනට පැමිණි සිරිමල්ගෙම පන්තියෙහි අයෙකු වූ ප්‍රගීත් විමසුවේය.

'' ඔව් ඒ මම තමයි ''

'' මං ආවේ තමුසෙට නිවේදනයක් කරන්ට.''

'' නිවේදනයක්.''

'' ඔව්,  තමුසෙට අද ඉඳලා හෝම් වර්ක් කරන්න බෑ. තව දෙයක්, අපේ පන්තියේ පලවෙනියා වෙන්නේ මම විතරමයි. තමුසේ පලවෙනියා වුණොත් බලාගමු.''

'' මම  ඔයා කියන දේවල් නොකළොත්? අනික ඔයා කවුද මට එහෙම කියන්න?''

'' මම කවුද? මම ප්‍රගීත්. මගේ තාත්තා මේ රටේ මන්ත්‍රී කෙනෙක්.''

'' මං මොකටද ඔයා කියන කියන පදයට නටන්නේ?'' සිරිමල් දැඩිව කියා සිටියේය.

'' ආ එහෙමද? දැන් උඹට තේරෙයි.'' එසේ පැවසූ ප්‍රගීත් සිරිමල්ට නැඹුරු වී ඔහුගේ කමිස කොලරයෙන් අල්ලා ගත්තේය. අනතුරුව ඔහුට පහර පිට පහර ගසන්නට වූවේය. අවටින් ඇවිද  යමින්  හා ක්‍රීඩාවේ යෙදෙමින් සිටි ළමෝ ද ඔවුන්ගේ පොරය දැක ඒ වටා රොක් වන්නට වූහ. රණ්ඩුව දුරදිග යාමට අත්වැල් සපයන්නට මෙන් ඔවුන් ප්‍රගීත් උදෙසා ඔල්වරසන් දෙන්නට වූහ. එනිසා ප්‍රගීත් සිරිමල්ට බිම පෙරළා ගැසීමට තරම් මුරණ්ඩු වූහ.

මේ මහත් වූ කෑගැසිල්ල ගමන් කරමින් සිටි ප්‍රධාන ශිෂ්‍ය නායක තිවංක ඒ වෙත දිව  ආවේය. එක්වරම ඔල්වරසන් හඬ බාල වන්නට විය. එතැන රොක්ව සිටි ළමෝ ඔහුව දැක දිව යන්නට විය. සිරිමල්ට පහරදෙමින් සිටි ප්‍රගීත් මදකට පහර දීම නවතා වටපිට බැලුවේය.

'' තමුසේ මොනවද මේ කරන්නේ, යනවා යන්ට මෙතනින්. පස්සේ ප්‍රින්සිපල්ගේ ඔෆිස් එකේ දී හම්බ වෙමු.'' තිවංක ඔහුට අවවාද කළේය. වහා නැගී සිටි ප්‍රගීත් සිරිමල්ට පහ පහරක් එල්ල කර දිව ගියේය.

'' ඒයි ඒයි   '' තිවංක කෑගැසුවේය. සිරිමල් කෙඳිරිගාමින් බිම වැතිර සිටියේය.  ඔහුගේ  දනිසෙන් හා  කටින් රුධිරය වැගිරෙමින් තිබිණ. තිවංකගේ මිතුරන් තිදෙනකුද එදෙසට ආහ.

'' මල්ලි ඔයාට නැගිටින්ට පුලුවන්ද?'' තිවංක කාරුණිකව විමසුවේය.

'' අයියේ මගේ කකුල හොඳටම රිදෙනවා මොකක්දෝ වෙලා වගේ. අත නම් හොලවන්නවත් බෑ. සිරිමල් හඬමින් පැවසුවේය.

'' ශෙරාන් ලසිත් මට උදව් වෙන්න මේ මල්ලිව උස්සන්න. මලික් ඔයා මේ මල්ලිගේ කකුල් දෙක හිමීට  උස්සන්න. අපි මෙයාව සික්  රූම් එකට ඇරගෙන යමු.'' තිවංක තම සගයන්ට පැවසුවේය.

***************

'' මොකද ළමයි මේ මොකද්ද වුණේ?'' සිරිමල් හා සිරිමල්ව ඔසවා ගෙන එන පිරිසගෙන් එසේ විමසූවේ මග දී හමු වූ විදුහල්පතිතුමා ය.

'' සර් මේ.''

'' හරි හරි, මේ ළමයව සික්රූම් එකට ගෙනියලාම මට කාරණාව කියන්නකො'' සියල්ලන්ම අසනීප වූවත් රඳවන කුටිය වෙත ගියහ.

'' කොහොමද ඩොක්ටර් ළමයට?'' විදුහල්පතිතුමා එහි වූ වෛද්‍යවරයාගෙන් විමසුවේය.

'' ඒ දරුවාගේ වම් අතයි,  දකුණු කකුලයි කැඩිලා. ටික දවසක් බෙහෙත් කරන්න වෙයි!

'' ඒ කියන්නේ දරුවගෙ තත්ත්වය බරපතළයි නේද? තුවාලත් වෙලා. මම දැන්මම භාරකාරයන්ට දන්වන්නම්. ඊට කලින් සිද්ද වෙච්ච දේ දැනගන්න ඕනේ.'' ඔහු තිවංක දෙසත් වෛද්‍යවරයා දෙසත් බලමින් කීවේය. ඊට පිළිතුරු වශයෙන් සිරිමල් තිවංක සිදු වූ සියල්ල ඔහුට පැහැදිලි කළේය.

***************

'' පුතේ ඔක්කොම ලැස්ති කරාද?'' වික්‍රම මහතා තිවංකගෙන් විමසුවේය.

'' ඔව් අංකල් සේරම හරි. එයාලා දැන් එනවා ඇති.'' ඔහු පිළිතුරු දුන්නේ ය. ඔවුන් මේ මග බලා සිටින්නේ සිරිමලත් නිමාලි මහත්මියත් එනතුරුය. සිරිමල්ට බෙහෙත් බැඳීම උදෙසා ඇය ඔහුව කැටුව ගියාය. එදින විශේෂ දිනකි. ඒ සිරිමල්ගේ උපන්දිනය නිසාය. වික්‍රම යුවලත් තිවංකත් එක්ව සිරිමල් උදෙසා උපන්දින සාදයක් සූදානම් කළහ.

'' අන්න එනවා, දොර වැහුවා නේද?'' වික්‍රම මහතා ජනේලයෙන් එබෙමින් විමසුවේය.

'' ඔව් අංකල් '' ඔවුන් මොහොතක් නිහඬව බලා සිටියහ. ක්ෂණයකින් නිවසෙහි දොර විවර විය. සියල්ලන්ම එක්වර සිරිමල් වෙත ගොස් ප්‍රීති ඝෝෂා නංවමින් සුබපැතුම් ගීය ගැයූහ. අනතුරුව කේක් ගෙඩිය කපා බෙදා හදා ගත් හ. සියල්ල සිදු වූයේ අල්ලා ගත නොහැකි වේගයෙනි.

'' එන්න දැන් තෑගි බලන වෙලාව.'' නිමාලි මහත්මිය කීවාය. නිමාලි මහත්මිය විසිතුරු කඩදාසියෙන් එතූ විශාල පාර්සලයක් සිරිමල් අත තැබුවේය.

'' මේක මගෙල් මල්ලිට.'' තිවංක ද විශාල පාර්සලයක් සිරිමල්ට පෑවේය.

'' තැන්ක් යූ '' සිරිමල් සියල්ලන්ටම තුති පුද කළේය.

'' හෝව්! හෝව්! '' හොඳම තෑග්ග තාම දුන්නේ නැනේ.'' වික්‍රම මහතා ඊට බාධා කරමින් තවත් කුඩා පාර්සලයක් ඔහු අත තැබුවේ ය. '' දැන්ම ඇරලා බලන්ට.''

සිරිමල් මහත් උද්‍යෝගයෙන් එය විවර කර බැලුවේය. එහි වූයේ මුද්‍රණය කළ පොත් දෙකකි. සිරිමල් එදෙස බලා විස්මයට පත් වූයේය.

'' මාමේ මේ මං ලියපු පොත් දෙක නේද?''

'' ඔව්! ඔව්! පුතා, අතුරුදහන් වෙලා හිටපු කාලේ තමා මං මේ පොත් දෙක ඔයාගේ මේසේ උඩ තියෙනවා දැක්කේ. ඉතින් මං ඒ දවස්වලම මේවා ප්‍රින්ට් කරන්න බාර දුන්නා.'' වික්‍රම මහතා පිළිවදන් දුන්නේය.

'' මල්ලි දන්නවාද මේ පොත් දෙක දැන් ගොඩක් ජනප්‍රියයි. මමත් කියෙව්වා. ඔයා හරිම ලස්සනට ලියලා තියෙනවා.'' තිවංක කීවේ ය.

'' ඒත්!....''

'' මං දන්නවා පුතා කියන්න යන දේ ගැන.'' වික්‍රම මහතා සිරිමල් දෙස බලමින් කීවේය. '' පුතා වදවෙන්නෙ පුතා ජීවතුන් අතර කියලා ගමේ අයයි පවුලේ අයයි දැනගනියි කියලා නේද?''

සිරිමල් හිස සලා එය පිළිගත්තේ ය.

'' පුතා මේ බලන්ට රචකයාගේ නමට මම දාලා තියෙන්නේ සිතුම් කියලා නේද? ඇත්තටම කිව්වොත් ඒක කෙටි යෙදුමක් ''

'' කෙටි යෙදුමක් ''

'' ඔව්! '' සි'' යන්නෙන් අදහස් වෙන්නේ සිරිමල් කියන නම. තු යන්නෙන් තුෂාර '' ම'' යන්නෙන් මහකුඹුර ඒ කියන්නේ සිරිමල් තුෂාර මහකුඹුර.''

'' ඒ අදහස නම් නියමයි මාමේ. තැන්ක් යූ. මේක තමා මට ලැබුණු හොඳම උපන් දින තෑග්ග. සිරිමල් ප්‍රීතියෙන් උමතුවී කියෙව්වේය.

***************

## 06. කාලය ඉගිල යයි

'' පොඩි බේබි! පොඩි බේබි ව හම්බ වෙන්න මහත්තයෙක් ඇවිල්ලා.'' පියසිරි සිරිමල්ගෙ කුටියට එබෙමින් කීවේය.

'' මේ වෙලාවේ කවුද?'' මෙම සංවාදය සිදුවන්නේ වසර හයකට පසුවය. කාලය ඉගිල ගියේ අල්ලා ගත නොහැකි චණ්ඩ මාරුතයක් මෙනි. සිරිමල් වහ-වහා අමුත්තා මුණගැසීමට පහත මාලය වෙත ගියේය. ඔහු සිරිමල් එනතුරු මහත් නොඉවසිල්ලෙන් පසු වූයේය.

'' අයියේ ඔයා! කවද්ද ආවේ?''

'' ඊයේ උදේ.'' අමුත්තා පිළිතුරු දුන්නේ ය. ඒ අමුත්තා වෙන කිසිවෙකුත් නොව තිවංකය.

'' කෝ අනිත් අය?''

'' නැන්දයි මාමයි ටවුමට ගියා.''

'' ඔයාගේ අලුත් පොත නම් නියමයි. ඔයාලව පැහැර ගත්තු සිද්ධිය ඔයා ලස්සනට ලියලා තියෙනවා. ඒකට රාජ්‍ය සම්මානත් හම්බ වුණාලු නේද?''

'' ඔව්! ඔයාගේ වැඩත් එක්ක ඔයාට වෙලාවක් තියෙනවද පොත් කියවන්න?'' ඔහු එසේ විමසූයේ තිවංක දැන් ගුවන් නියමුවෙක් නිසාය.

'' ගුවන්තොටුපලක නැවතුනාම අනිත් ටුවර් එක යනකල් මගේ වැඩේ පොත් කියවන එක තමයි.''

'' ඒක නෙවෙයි කෙවින් අයියා ගැන ආරංචියක් නැත්ද?''

'' මිනිහ අවුරුදු හයකට කලින් ගියා ගියාමයි ෆෝන් ආන්සර් කරන්නෙත් නෑ. අපිට කෝල් කරන්නෙත් නෑ.''

'' අනේ ඔව්! මාමයි නැන්දයිත් ඒ ගැන හරි කලකිරීමෙන් ඉන්නේ.''

'' කමක් නෑ කවදාහරි තමන්ගේ රට මතක් වෙයිනේ.''

'' අයියා හුග කාලෙකින්නේ ආවේ, දවල්ටත් කාලම යමු.''

'' මල්ලිට බෑ කියන්ටත් බෑනේ. හරි මම ඉන්නම්.'' ඔහු කීවේය.

**************

'' ලොකු පුතේ මොකක්ද උඹ ඔය ඔච්චර ආසාවෙන් කියවන්නේ. අද මොනවද පත්තරේ තියෙන්නේ?''

'' නෑ අම්මේ, මේකෙ මේ රාජ්‍ය සම්මාන දිනපු පොතක් ගැන තියෙනවා.''

'' උඹ කියෙව්වේ එච්චර පොඩි දෙයක් වෙන්ට නම් බෑ.''

'' ඔව් ඒ පොත ලියලා තියෙන්නේ අපේ මල්ලිගෙ වයස මහත්තයෙක්. මට මතකයි අපේ මල්ලිත් ඉස්සර හැමදාම හවසට පොතක් ලියනවා. හැබැයි කවදාවත් මට ඒක බලන්න දීල නෑ.''

''අනේ උත් අපිත් එක්ක හිටියානම්.'' සිරිමල්ගෙ මව කීය.

'' පොඩි නංගිට දැන් මල්ලි ගැන කිසිම මතකයක් නෑ.''

'' කවුද අප්පච්චි ඒ!'' ඔවුන්ගේ කතාබහ මැදට තුන් හැවිරිදි ළදැරියක් ද හවුල් වීමට ආවාය.

'' යන්ට අම්මා ළඟට, ලොකු අයගේ කතා මැදට පොඩි අය පනින එක නරක පුරුද්දක්.'' පියාගේ නිවේදනයෙන් කුඩා ළදැරිය ආ පයින්ම තම මව වෙත දිව ගියාය.

'' ඒ දරුවාට ඒ දරුවාගේ බාප්පා ගැන කිව්වයි කියලා මක් වෙනවද?''

'' ප්‍රියංගි මට තේ කහට ඩිංගිත්තක් !'' මවගේ හඬ නෑසුනා සේ ඔහු තම බිරිඳට ඇමතුවේය.

**************

සිරිමල් සැදෑවේ පොතක් ලියමින් සිටියේය. නිමාලි මහත්මියත් වික්‍රම මහතාත් ඔහු වෙත ගියේය.

'' පුතා පොඩි දෙයක් කතා කරන්න පුලුවන්ද?''

'' එන්න මාමේ කියන්න.''

'' පුතා දැන් අම්මා තාත්තා බලන්න යන්න ඕන. ඔය තරහ දැන් හිතින් අමතක කරන්න.''

'' ඒත් මාමේ!''

'' ඔව් පුතා, ඔයා තමන්ගේ දෙමව්පියන් ගැනත් බලන්න ඕනෑ. ඒක ඔයාගේ යුතුකමක්.'' නිමාලි මහත්මිය කීය.

'' හැබැයි ඔයා හිතන්න එපා අපි ඔයාව එලවනවා කියලා. ඔයාට හැමදාම අපිත් එක්ක ඉන්න පුළුවන්.''

'' ඔව් මං ඒ ගැන දන්නවා.''

'' දැන් පුතා මේ රටේ ජනප්‍රිය ලේඛකයෙක්. ඒක ඔයාගේ හීනෙ. පුතා ගමට යන්නම ඕන. ඔයාගේ යුතුකම් ඉෂ්ඨ කරන්න. පුතාව හැමෝම ආදරයෙන් පිළිගනී.'' වික්‍රම මහතා සිරිමල්ගේ හිස අතගාමින් කීවේය.

'' එහෙනම් මං හෙටම යනවා.'' ඔහු හිටිහැටියේම එසේ කීවේ මහත් වූ උද්‍යෝගයෙන්ය.

***************

කාලය යළිත් ඉගිල යන්නට විය, සිරිමල් උදෑසනින්ම තම කාරයෙන් ගමන පිටත් වුණේය. හෝරා ගණනාවක් ගත විය. ඔහු තම මතක හා තර්ක කරමින් සිටියේය.
'' දැන්නම් මම ගම කිට්ටුවම ඉන්න ඕනේ.'' සිරිමල් මාර්ගයේ කොනක කාරය නවතමින් ගිමන් හරින්නට වූයේය. මග දෙපස නිල්ල ගැසුණු ගොයමින් සැරසී තිබිණ. ඔහුගේ හද ගොයමෙහි අසිරියට දැහැන්ගත වන්නට විය. ඔහු තම අතීත මතකයෙහි සැරිසරන්නට වූයේය. තණකොල මිටියක් හිස මත තබා ගත් මැදි වියේ මිනිසකු හිටිහැටියේම සිරිමල්ගේ කාරය අසලින් ගමන් කළේය.

'' මාමේ, මිණිගස්තැන්න  ගමට තව කොච්චර දුරද?'' සිරිමල් විචාළේය.

'' මේ මිණිගස්තැන්න ගම තමයි මහත්තයෝ.''

'' එතකොට අර ඉස්සර තිබ්බ ගුරු පාර?''

'' අර තුන්මං හන්දියෙන් වමට හැරෙන්න. එතකොට බොරළු පාරක් හම්බ වෙයි. ඒ තමයි ගුරුපාර.''

'' බොහොම ස්තූතියි මාමේ!'' සිරිමල් එසේ කියමින් යළිත් ගමන ඇරඹුවේය. ඔහුට නොදැනීම ඔහු නිවසට සමීප වී ඇත. එදා මැටි ගෑ ගෙවල් අද ගඩොල් බැඳී කපරාරු නොකළ නිවාස ලෙස දියුණු වී තිබිණ. ඔහු තම සොහොයුරා වගා කළ හේන පසුකොට නිවස අසලටම සමීප විය. නිවස ගඩොලින් බැඳ ටකරන් සෙවිලි කර තිබිණ. ඔහු වැට කඩුල්ල ඔසවා ගෙමිදුල වෙත ගියේය. ගෙමිදුලෙහි සෙල්ලම් බත් උයමින් සිටි ළදැරියක් ඔහුව දැක හනික ගෙට වැදිණ. ඇයගේ කෑගැහිල්ලට නිවසෙහි වූ නිවැසියන් පිටතට දිව ආහ. මෙතෙක් වේලා සිරිමල්ගේ නෙතක රැඳී සිටි කඳුලැලි අව් කණ්ණාඩිය ට මුවා වී බලා සිටින්නට විය.

'' මේ මහත්තයා කවුද?'' ඔහුගේ පියා සරම පහතට හෙළමින් විමසුවේය. ඔහුගේ පියා වැහැරි මහලු වී සිටින දුටු සිරිමල්ගේ කඳුලැලි අනුකම්පා විරහිතව ඔහුගේ කම්මුල දිගේ පහතට රූටන්නට විය. ඔහු තම අව් කණ්ණාඩිය කලවා තම කඳුළැලි පිස දැමුවේය.

'' අප්පච්චි '' සිරිමල්ගේ මුවින් එවදන ගිලිහෙන්නට විය.

'' කවුද මහත්තයා ඔබතුමා?'' ඔහුගේ මව කුහුලින් විමසුවේය.

'' අම්මේ මම මැරිච්ච පුතා සිරිමල්!''

'' මල්ලියේ උඹ!'' සිරිමල්ගේ සහෝදරයා ඔහුව හැඳින වැළඳ ගත්තේය.

'' ලොකු පුතේ කවුද මේ?'' සිරිමල් ගේ සහෝදරයා අතීතය සිහිපත් කරමින් සිදු වූ සියල්ල පැහැදිලි කළේය. ඔවුන් සියල්ලන්ම එවදන් අසා සිටියේ කඳුළු පිරි දෙනෙතිනි.

'' මයෙ පුතේ උඹ මලේ නැහැ එහෙනම්! මට සමාවෙයන් රත්තරනේ!'' ඔහුගේ පියා හා මව උමතු වූ අයුරින් සිරිමල් ව වැළඳගන්නට විය.

'' මයෙ පුතේ, උඹ මෙතුවක් කල් කොහෙද හිටියේ? මොකද කළේ? ඔහුගේ මව විමසුවේය.

'' මං මෙච්චර කාලයක් කොළඹ හිටියේ.''

'' එහිදී උඹ මොනවද කළේ පුතේ?''

'' මං ඉස්කෝලේ ගියා. විභාගෙ පාස් වෙලා විශ්වවිද්‍යාලේ ගියා.'' ඔහු පිළිතුරු දුන්නේ ය.

'' පුතාට මහන්සිත් ඇතිනේ, යමු ඇතුලට ගිහින් කතා කරමු.''

'' හොඳයි අම්මේ.''

සියල්ලෝම ගෙතුලට ගොස් අසුන් ගත්හ.

'' කාගෙද අම්මේ අර පොඩි දරුවා.''

'' ඒ උබේ අයියගේ දරුවා.''

'' ඒ කියන්නේ අම්මේ?''

'' ඔව් උඹ හරි, අයියා කසාද බැන්දා.'' එවිට ඔහුගේ සහෝදරයාගේ බිරිඳ එදෙසට ආවාය.

'' මේ තමයි අයියගෙ නෝනා.''

'' අක්කේ '' සිරිමල් ඇයට ඇමතුවේ ය.

'' කවුද අම්මේ මේ මහත්තයා?'' ඇය විස්මයෙන් විමසුවාය.

'' දූව හිතන්නේ කවුරු කියලද?''

'' අනේ මන්දා අම්මේ.''

'' පුතේ මේ අපේ නැතිවෙච්චි පුතා සිරිමල්.''

'' නැතිවෙච්චි පුතා.''

'' ඔව් '' සිරිමල්ගේ සහෝදරයා ඇයව අනුමත කළේය. අනතුරුව ඔහු සිදු වූ සියල්ල ඇයට ද පැහැදිලි කළේය.

'' ඇයි ලොකු පුතේ උඹ මේ වගක් දැන දැනත් අපිට නොකිව්වේ?'' මව හැඬුම්බරව විමසුවාය.

''  අම්මේ කෝ නංගි? එයා දැන් ගොඩක් ලොකුයිද? මට දකින්නත් ආසයි.'' සිරිමල් කතාව වෙනතකට හරවමින් විමසුවේය.

'' දැන් නංගි මග එනවා ඇති.'' එවිටම වාගේ කිසිවෙකු වැට කඩුල්ල ඔසවා ගෙමිදුලට ඇතුල් වූහ.

'' ඔය එන්නේ මතක් කරනකොටම. මා  දූ  මෙන්න මෙහාට ඩිංගිත්තක් ආවනම්.''

'' ඇයි අම්මේ.'' පාසල් නිල ඇඳුමින් සැරසුණු දැරියක් නිවසට එබෙමින් විමසුවාය.

'' ඔයා දන්නවාද මේ කවුද කියලා.''

'' නෑ අප්පච්චි.''

'' මේ උඹේ පොඩි අයියා.''

'' පොඩි අයියා! එයා මැරුනණෙ.''

'' නෑ මා දූ.''

'' ඒ කොහොමද?''

'' ඒක දිග කතාවක් නංගී, මම ඔයාට පස්සේ ඒ ගැන කියන්නම්කො. නංගී පොඩි අයිය ගාවට එන්නේ නැද්ද ඉතින්?'' ඔහු විමසුවේය. කුඩා දැරිය ඔහුව සතුටින් වැළඳ ගත්තාය.

'' මල්ලි ඉතින් අපි තේ ටිකක් බීලා ඉමු. පස්සේ කතා කරන්න බැරියැ.'' ඔහුගේ සහෝදරයාගේ බිරිඳ තේ පිළිගන්වමින් කීවාය.

'' හොඳයි අක්කේ.''

'' මල්ලි එදා ගමින් ගියාට පස්සේ මොනවද කරේ?''

'' මම වික්‍රම මාමාගේ ගෙදර නැවතුනා. ඒත්!'' ඔහු මදකට තම කතාව නවතා අතීතයට එබිකම් කළේය. ඔහු මඳකට පසු යළිත් තම කතාව ඇරඹුවේය.

'' මාවයි තව අයියා කෙනෙකුයි මිනිස්සු කට්ටියක් පැහැරගෙන ගියා. ඒ පාළු කැලෑවකට. ඒ මිනිස්සු දෙන්නා නියගලා අල කාල මැරුණා. අවුරුද්දකට විතර පස්සේ ඉතින් අපි බේරුනා.''

'' මටත් මතකයි වංගියක් පොලිසියේ මහත්වරු වගයක් අතුරුදහන් වෙච්චි ළමයි වගයක් මේ ගම් තුලානේත් හෙව්වා.'' සිරිමල්ගේ සහෝදරයා කීවේය.

***************

'' ඒයි බං උඹට මතකද අකාලයේ මල සිරිමල්කොලුවාව? ඌ ආපිට ගමට ඇවිල්ලාලු බං.''

'' කොහොමද බං මළ එවුන් ආපිට එන්නේ? උඹට අමු කැවිලද?''

'' ඇත්ත මාමේ, ඒ කතාව මටත් ආරංචි වුණා.'' කඩමණ්ඩියෙන් ලැවරිය කකා උන් ගැමියන්ගේ කතාවලට මැදිහත් වෙමින් කමලා පැවසුවාය.

'' වෙන්ටැති ළමයො. ගින්නක් නැතිව දුමක් නගින්නෙ නැනේ.'' එවිටම කඩය ඉදිරිපිට නිල් පැහැති කාරයක් නැවත බැවින් ඔවුන් කතාබහ නවතා විමතියෙන් බලා සිටින්නට වූහ.

'' සයිමන් මාමේ.'' සිරිමල් කාරයෙන් බැස ඒ දෙසට පැමිණෙමින් ගැමියෙකුට ඇමතුවේය.

'' මේ මහත්තයා කවුද?''

'' මම මැණික් ගරන සිරිපාලගේ පුතා. අඹගහමුල ගෙදර.'' සිරිමල් නොපැකිළව ඔවුන්ට තමාව හඳුන්වා දුන්නේය.

'' මොකක්? ඒ කියන්නේ ඔයා සිරිමල්ද?'' කමලා විස්මයෙන් විමසුවාය.

'' ඔව් ''

'' උඹ අවතාරයක් නෙවෙයි නේද මහත්තයෝ?''

'' ඔය මහත්තයා පට්ටම් උවමනා නෑ මාමේ මට. මං මළේ නෑ.''

'' ඒත් පුතාගේ මළගමට අපිත් ගියා නෙව.''

'' ඒ මං නෙවෙයි. මං මළේ නම් මෙහෙම ඉදීයි ද මාමේ? එදා මං අප්පච්චි රවට්ටන්න ගඟට පොල් ගෙඩි ටිකක් විසි කළා. ඒ මං ගඟට පැන්නා කියලා හඟවන්ට. මගේ කමිසෙයි, සෙරෙප්පු දෙකයි එතන තියලා ගියේ ඒ හින්දම තමයි.''

'' ඉතින් මෙතුවක් කල් උඹ කොහෙද හිටියේ?''

'' කොළඹ'' ඔහු පිළිතුරු දුන්නේ ය.

කඩේට ගෙදරින් කීයක් ණය තියෙනවද කමලා?'' මදක් නිහඬව සිටි ඔහුට තම නිවසෙහි අගහිඟකම් සිහිපත් විය.

'' මං හිතන්නේ රුපියල් තුන්දාස් ගානක්. ආ ඔව් මේ තියෙන්නෙ. රුපියල් තුන්දාස් දෙසියයි.'' ඇය කඩදාසියක් දිග හරිමින් පිළිතුරු දුන්නාය.

'' ආ මෙන්න. ඒ ගාන ඇරගෙන මට සීනිබෝල පැකට් දෙකකුත් දෙන්න. ඉතුරු සල්ලි තියාගන්න. අම්මලා බඩු ගන්න වෙලාවකදි ඒ සල්ලි වලින් ගන්න.

'' ආ මෙන්න.'' කමලා ඔහුට සීනි බෝල පැකට් දෙකක් දුන්නාය.

'' එහෙනම් මම ගිහින් එන්නම්.'' ඔහු ඒවා සියතට ගත්තේ සියල්ලන්ගෙන්ම සමුගනිමිනි.

***************

පසුදින සිරිමල්ගේ පියා උදෑසන ආහාරපාන ගනිමින් සිටියදී නිවස ඉදිරිපිට සුදු පැහැති වෑන් රියක් නවත්වන්නට විය. එවිගසම සිරිමල් නිවසින් පිටතට පැමිණියේය.

'' ඉතින් සිරිමල් මහත්තයා.'' මිනිසුන් කිහිප දෙනෙක් වෑන් රියෙන් බසිමින් ඔහුට ඇමතුවේය.

'' මේ අර පත්තරෙන් එනවා කිවුව මහත්තුරු නේද?'' සිරිමල් විමසුවේය.

'' ඔව් '' තවකෙක් ඔහුට පිළිතුරු දුන්නේය.

'' ආ මට මාමා උදේ කෝල් කරලා කිව්වා ඔය ගොල්ලෝ මෙහෙ එනවා කියලා. ගෙදර හොයා ගන්න අමාරු වුණේ නැනේ?''

'' නෑ ''

'' එහෙනම් අපි ඇතුලට යමු.''

'' ඇත්තටම අපි ආවෙ මහත්තයා ගැනයි. මහත්තයාගේ රාජ්‍ය සම්මාන දිනපු අලුත් පොත ''මල් වීදුරු'' ගැනයි තොරතුරු ටිකක් දැනගන්න.'' ඔවුන් අසුන් ගනිමින් කීය.

'' හොඳයි, ඔය මහත්තුරු ඕනෑම දෙයක් අහන්න. මං පුළුවන් විදියට උත්තර දෙන්නම්.'' සිරිමල් කීය.

'' එහෙනම් අපි කල් අරින්නේ නැතිව වැඩේ පටන් ගනිමු.'' ඔවුන් සිරිමල් වෙත බොහෝ පැනයන් නැගූහ.

***************

'' පුතේ, අර මහත්තුරු මොකද පුතාව හම්බවෙන්න ආවේ?'' සිරිමල්ගේ පියා පිටව යන පිරිස දෙස බලමින් සිරිමල්ගෙන් විමසුවේය.
'' අප්පච්චිට ඒක හෙට අනිද්දා දිහාට දැනගන්න පුලුවන් වෙයි.'' ඔහු පිළිතුරු දුන්නේ ය.

***************

'' ආයුබෝවන්ඩ පත්තරේ බලන්නේයිද?'' සිරිමල්ගෙ සහෝදරයා කඩමණ්ඩිය වෙත ඇදෙමින් විමසුවේය.

'' ඒක නෙමෙයි බං උඹලගෙ මල්ලි ගමට ආ කාරණාව හැබෑවක්ද?'' පත්තරයෙන් පිටත බලමින් ගමේ බස් රියදුරා ඔහුගෙන්ද පැනයක් විමසුවේය.

'' ඔව් ඒ කාරණාව හැබෑව.''

'' මට මේන් මේක කියපන්, උඹේ මලයගෙ නම මොකක්ද?''

'' සිරිමල් තුෂාර මහකුඹුර.''ඔහු පිළිතුරු දුන්නේ ය.

'' එහෙනම් බලපං මේ රූපෙ ඉන්නෙ මල්ලිද කියලා.'' ඔහු එසේ කියා පුවත්පත සිරිමල්ගේ සහෝදරයගෙ අත තැබුවේය.

'' ඔව්, මේ අපේ මල්ලි තමා.'' ඔහු පිළිතුරු දුන්නේ ඒ දෙස විස්මයෙන් බලමිනි. රාජ්‍ය සම්මාන දිනූ 'මල් වීදුරු' නව කතාවේ රචක වසරේ හොඳම නැගී එන ග්‍රන්ථ රචකයා.'' ඔහු එය හඬනගා කියෙව්වේය.

'' මුදලාලි මං මේ පත්තරේ කියවලා අරන් එන්න ද?''

'' හා ළමයො අරන් යන්න.'' මුදලාලි ඔහුට ඊට අවසර දුන්නේය. සිරිමල්ගෙ සහෝදරයා පුවත්පත ද රැගෙන හනික ආපිට තම නිවස කරා දිව ගියේය.

***************

සිරිමල්ගෙ සහෝදරයා බාල වියේදී මෙන් වැට කඩුල්ලද නොතකා ඒ මතින් පැන ගියේ ඔහුගේ ආරංචිය පවුලේ අයට කීමේ ආශාවෙනි. ඔහු හඬ නගා සියල්ලටම හඬ ගෑවේය.

'' මොකක්ද ලොකු පුතේ මේ නෛයියාඩගම?'' මව ඔහුගෙන් විමසුවේ ය.

'' ඇත්තට මොකද පුතේ මේ?''

'' අප්පච්චි කෝ මල්ලි?''

'' පුතා ගියා ගඟ පැත්තට.''

'' ඇයි පුතේ මොකක් හරි වින්නැහියක්ද?''

'' නෑ අම්මේ, මේ පත්තරේ කියවල බලන්නකෝ.''

'' උඹම ඉතින් අපි හැමෝටම ඇහෙන්ට කියවන්නකෝ.'' සිරිමල්ගේ පියා කීය.

ඔහු එය අනුමත කරමින් සියල්ලන් හටම ඇසෙන සේ පුවත්පත කියෙව්වේය. නිවසියන් එය අසා සිටියේ කනින් පමණක් නොව මුවද අයාගෙනය.

'' බලන්ට අප්පච්චි මේ අපේ මල්ලිගේ පින්තූරයකුත් තියෙන්නේ.''

'' කෝ දීපන් බලන්ට.'' ඔහු ගේ පියා පුවත් පතට නැඹුරු වෙමින් කීය.

'' හැබෑ නේන්නම්, මේ අපේ පොඩි කොලුවානේ.''

'' ඒක ඇහුවායින් පස්සේ මගේ හිත මහා ලොකු බරකින් නිදහස් වුණා වගේ.'' සිරිමල්ගෙ මව හැඟුම්බරව කීවාය.

'' ඒ මොකැයි හාමිනේ?''

'' මයේ හිතේ හැකයක් තිබුණා පුතා කොලඹ රටෙන් ඔච්චර සල්ලිකාරයෙක් වෙලා එන්ඩ තරම් කරන රස්සාව මොකක්ද කියලා.''

'' අම්මට මතකද මං වංගියක් පත්තරේ බලද්දි දැක්ක ලිපිය. ඒ අර පොතක් ගැන තිබ්බේ?''

'' ඔව් ''

'' ඒක ලියල තියෙන්නෙත් මල්ලිම තමයි. සිතුම් කියන්නෙත් මල්ලිටම තමයි. මල්ලි එයාගේ නම කෙටි කරලා තමයි ඒ නම හදාගෙන තියෙන්නෙ. අප්පච්චි පත්තරේ ඔක්කොම ලිපිය කියවලා බලන්ඩකෝ. මං අපේ සිතුම් මහත්තයාව එක්කගෙන එන්නම්කො.''

'' එහෙනම් කොලුවා එදා පත්තරම මහත්තුරු ගමට ආපු දවසේ නොකිව්වේ මේ කාරණාව තමයි.''

'' හරි හරි බොල ඔය වගක් පුතණ්ඩියා ආ වෙලාවටම අහගත්තා නම් හොඳයි.'' සිරිමල්ගෙ මව කීවාය.

***************

සිරිමල් ගං ඉවුරෙහි වූ ගල්තලාවක් මත ඉඳ හුදකලාව අතීතය නම් ගංගාවෙහි යාත්‍රා කළේය. එහා ඉවුරේ සිට අහස් කුස සිඹින හුදකලා කඳු වැටිය දෙස ඔහු බලා සිටියේය. ඒ ඔහුගේ අඳුර අතීතය සිහිපත් කරමිනි. බටහිර අහසට රැයෙහි මාවත පෙන්වමින් හිරු හුදකලා කඳු මුදුනින් අතුරුදන් වන්නට විය. ඒ ඔහුට අතීතයෙන් අනාගතයට පියමන් කරන්නටයි ඇරයුම් කිරීමට මෙනි. ඉහළින් වූ බොරළු පාර දෙසින් දෝංකාර දෙමින් යමෙකුගේ හඬක් ඔහුගේ හද සසල කරන්නට විය. එම හඬ කෙමෙන් කෙමෙන් ඔහු අසලට පැමිණ ලැඟුම් ගන්නට විය.

'' සිතුම් මහත්තයා '' ඒ වෙන කිසිවකුත් නොව ඔහුගේම සහෝදරයා බව ඔහු හැඳින ගත්තේ නොමේරූ සඳෙහි ආලෝකයෙනි. එම ඇමතුම ඔහුගේ හඳට අමුත් හැඟුමක් ඇති කරන්නට විය.

'' අයියේ, ඔයා එහෙනම් ඒක දැනගත්තද?'' ඔහු තම සහෝදරයගෙන් විචාළේය.

'' ඔව් '' ඔහු මොහොතක් නිහඬව හිඳ පිළිතුරු දුන්නේය. දැන් ගොඩක් කළුවර වැටිලා අපි ගෙදර යමු.

'' අපි යමු ''

***************

හුදකලා රැයක සිසිලස විඳිමින් සහෝදර දෙපළ නිවසට ගොඩ වැ දුණහ. වැට කඩුල්ල ඔසවන හඬ ඇසෙන තෙක් නිවැසියන් මහත් උනන්දුවෙන් පසු වූහ. ඔවුන් බලාපොරොත්තු වූ හඬ ඇසුණු විගස වහ වහා ගෙතුළට ආහාර ඔවුන් බලාපොරොත්තු වූ හඬ ඇසුණු විගස වහ වහා ගෙමිදුළට ආහ.

'' පොඩි පුතේ, ඇත්තද මේ පත්තරේ තියෙන කතාව?'' සිරිමල්ගෙ මව නෙතඟ රැඳී තුටු කඳුළු වහන් කරගනිමින් විචාළාය.

'' ඔව් අම්මේ.'' සිරිමල් පුවත් පතෙහි වූ ලිපිය දෙස බලමින් පිළිතුරු දුන්නේය.

'' මට සමාවෙයන් රත්තරනේ උඹට කරපු නොහොබිනාකම් වලට. මං හින්දා උඹේ ඉස්කෝලේ ගමන කඩාකප්පල් උනාට උඹ කොහොමහරි උඹේ ගමන ගියා නේද?'' සිරිමල්ගෙ පියා සන්තාපයෙන් කීවේය.

'' අප්පච්චි ඒ පරණ අතීතය අමතක කරන්න. මේ අද ගැන හිතන්න.''

'' උඹ මලෙයි කියන කාරණාව ඇහුවායින් පස්සේ අපි ජීවත් වුණේ මැරි මැරී, පිච්චි පිච්චි. මෙහෙම දෙයක් නොවෙන්ට උඹ එහෙන ම් අදටත් අව්වේ කර වෙවි මැණික් ගරනවා.''

'' අම්මේ ඔය දේවල් අමතක කරන්ටකෝ.'' සිරිමල් බාල වියේ මෙන් තම මවට තුරුලු වෙමින් කීවේය.

'' උඹ හරියට වෙනස් වෙලා මයෙ පුතේ, එදා ගමෙන් ගිය මයෙ පොඩි පුතා නෙවෙයි අද ගමට ඇවිත් ඉන්නේ. අද ඇවිත් ඉන්නේ උගත් ලොකු මහත්තයෙක්.'' සිරිමල්ගේ මව තුටු කඳුලු සලමින් කීවාය.

'' අම්මේ, අප්පච්චි! මං හෙට ආපිට කොළඹ යනවා. හැබැයි ආපිට නොඑන්න නෙවෙයි. මං සුමාන දෙකකට වතාවක් අනිවාර්යෙන්ම ඔයාලව බලන්න එනවා.

'' අනේ පුතේ ඇයි උඹ ආපිට යන්නේ? අපෙන් මොකක් හරි මදි පුංචි කමක්වත් වුනාද?''

'' නෑ අප්පච්චි, මං පුළුවන් හැම වෙලේම ගමට එන්නම්. මං අම්මලාට ආයෙ කවදාවත් බඩගින්නෙ ඉන්න දෙන්නේ නෑ.''

'' හරි පුතා, කැමති දෙයක් කරන්න.'' ඔහුගේ පියා කීවේය.

'' මල්ලි හින්දා අපි හැමෝටම ආඩම්බරයි නේද අම්මේ?'' මෙතෙක් වේලා නිහඬව සිටි සිරිමල්ගේ සොහොයුරාගේ බිරිඳ සිනාසෙමින් කීවාය.

'' ඔව් පොඩි පුතේ, උඹ අපිට විතරක් නෙවෙයි මුලු රටටම මැණිකක්. ඒ වගේම අපේ පවුලටම ආඩම්බරයක්.''

## 07.නොසිතූ හමුවීමක්

නිවසේ විදුලි සීනුව නාද විය.

'' අම්මේ, සිරිමල් පුතා! මං හිතුව පුතාටත් අපිව අමතක වෙලා කියලා.'' වික්‍රම මහතා මහත් සන්තෝෂයෙන් ඔහුව පිළිගත්තේය.

'' එහෙම කොහොමද අමතක වෙන්නේ මාමේ?'' සිරිමල් කීය. '' කෝ නැන්දා.''

'' නැන්දා ටවුමට ගියා. බලන්නකෝ කවුද ඇවිත් ඉන්නේ කියලා.'' වික්‍රම මහතා ආලින්දයෙහි වූ අමුත්තාව පෙන්වමින් කීවේය.

'' තිවංක අයියේ.'' ඒ අමුත්තා වෙන කිසිවකුත් නොවේ තිවංකය.

'' ඉතින් මල්ලි කොහොමද ගමේ ගමන?'' ඔහු සිරිමල්ගෙන් විචාළේය.

'' වරදක් නෑ අයියේ.''

'' පුතාට ගොඩක් මහන්සිත් ඇතිනේ. මං අපිට කන්ට මොනවා හරි ලෑස්ති කරන්නම්.'' එසේ කියූ වික්‍රම මහතා ආලින්දයෙන් පිටව ගියේය.

'' අයියාට මොකක් හරි ප්‍රශ්නයක්ද?'' සිරිමල් තිවංක ගේ මුහුණ දෙස බලමින් විචාළේය.

'' මල්ලි මං හීනෙකින්වත් හිතුවේ නැති දෙයක් සිද්ධ උනානේ.''

'' ඒ මොකක්ද අයියේ?''

'' මං ඊයේ ෆ්ලයිට් එකෙන් බැහැලා ටිකක් එයාපෝට් එකේ ඇවිද ඇවිද ඉන්නකොට කෙවින් මගේ ඇඟේ හැප්පිලා ගියා.''

'' ඉතිං එයා ඔයාට කතා කළාද?''

'' මොන මිනිහා තව සුද්දෝ දෙතුන් දෙනෙක් එක්ක මාව නොදැක්ක ගානට බලන්නෙවත් නැතිව ගියා.''

'' ඔයාට විශ්වාසද ඒ කෙවින් අයියාමයි කියලා?''

'' ඔව් මල්ලි, මිනිහා පෙනුමෙන් නම් හිටියා වගේමයි.''

'' අනේ මන්දා, ඒ ගැන එච්චර හිතන්න එපා.'' සිරිමල් ඔහුව සනසන්නට මෙන් කීවේය.

'' අයියේ, ඔයාට හෙට වැඩක් නැත්නම් යමුද මාත් එක්ක පාටියකට?''

'' මට නම් වැඩක් නෑ, හරි අපි යමු.''

***************

'' මල්ලි කොහෙද අපි යන පාටිය තියෙන්නේ?''

'' මගේ ඔෆිස් එකේ. මගේ යාළුවෝයි, මාව අගය කරන අයයි එකතු වෙලා පාටියක් සංවිධානය කරලා අර හොටෙල් එකේ.'' සිරිමල් ඉදිරියෙන් දිස්වෙන හෝටලය පෙන්වමින් කීවේය. මොහොතකට පසු කාරය හොටලයෙ වාහන නැවතුමේ නවත්වන්නට විය. සිරිමලුත් තිවංකත් හෝටලය තුලට ගියේ මහත් උද්යෝගයෙනි. ඔවුන් ආහාර පාන ගනිමින් සතුටු සාමීචියෙන් කතා බස් කරමින් විනෝද වූහ.

'' අයියේ මගේ කැමරාව වාහනේ දාලා ඇවිල්ලා. මං කාර් පාක් එකට ගිහින් එන්නම්.'' මොහොතකට පසු සිරිමල් තිවංක හට කීවේය.

'' මමත් එන්නම්. මගේ ෆෝන් එක චාර්ජ් එකට ගැහුවනේ.''

'' ආ එහෙනම් යමු.'' දෙදෙනාම තම අසුන් වලින් නැගිට ශාලාවෙන් පිටතට ගියහ. මදකට පසු ඔවුන් කාරය වෙත පැමිණුනහ.

'' අද පාටිය නම් හොඳට තියෙනවා නේද මල්ලි?'' තිවංක කීවේය.

'' ඒක නම් ඇත්ත.'' සිරිමල් කැමරාව හා තිවංකගේ ජංගම දුරකථනය පිටතට ගනිමින් එය අනුමත කළේය.

'' කවුද හිතුවේ අවුරුදු ගානකට කලින් සිද්ද වෙච්චි භයානක සිදුවීමක් මේ විදියට ජනප්‍රිය වෙයි කියලා. ඔයා ඒ ඇත්ත සිදුවීම පොතකට ගත්ත එක තමා ඒ සිදුවීමේ වටිනාකම.''

'' ඇත්ත, මට මේ අදහස දුන්නේ ඒ කැලෑවෙදීම කෙවින් අයියා. මං එයාට පොරොන්දු වුණා ඒ සිදුවීම මගේ හැකියාව ප්‍රයෝජනයට අරන් ලියනවා කියලා. ඒත් එයත් මට පොරොන්දුවක් වුණා.''

'' ඒත් එයා ඒක ඉෂ්ට කළේ නෑ නේද?'' තිවංක ඔහුගේ වචනට බාධා කරමින් විචාළේය. දෙදෙනාම වදනකුදු නොදොඩා මද දුරක් ඇවිද ගියහ. ඉදිරියෙහි වූ උද්‍යානයේ මිනිසකු තවත් විදේශිකයන් තිදෙනෙකු සමග ඡායාරූප ගනිමින් සිටියහ. තිවංක මොහොතක් නැවතී ඒ දෙස මහත් විස්මයෙන් බලා සිටියේය.

'' මල්ලි ඔයා දැක්කද අර මනුස්සයව?''

'' අර ලංකාවේ මනුස්සයාවද? අර ෙෆාරිනස්ලා ටිකකුත් එක්ක පොටෝස් ගහන්නෙ?''

'' ඔව්, ඒ වෙන කවුරුවත් නෙවෙයි කෙවින්.''

'' මොකක්?'' සිරිමල් විස්මයෙන් විමසුවේය. '' අපි එයාට කතා කරනවද?''

'' නෑ, අන්න මිනිහා මේ පැත්තට එනව. අපිට කතා නොකර ගියොත් අපි බලෙන් හරි කතා කරමු.'' සිරිමල් ඔහුගේ වචන අනුමත කරමින් සිටි වනම රැඳී සිටියේය,

ඔවුන් සිතූ අයුරින් ඔහු ඔවුන්ව නොදැක්කා සේ පසුකර ගියේය.

'' ඒයි මිස්ටර්.'' තිවංක ඔහුගේ ගමනට බාධා කළේය.

'' ප්ලීස් ගිව් අ වන් මිනිට්''කෙවින් තම සගයන්ගෙන් අවසර ගත්තේ ය. ඔහුගේ වදනින් විදේශිකයන් පිරිස හෝටලය වෙත ගියහ.

'' ඇයි මගේ ගමනට බාධා කළේ?'' ඔහු තම කෝපය සඟවා ගනිමින් විමසුවේය.

'' මේ මිස්ටර් කෙවින් නේද?'' තිවංක විචාළේය.

'' ඔව්, තමුන් කොහොමද මාව දන්නේ?''

'' මම ගුවන් නියමුවෙක්, එතකොට මේ අපේ රටේ ප්‍රසිද්ධ ලේඛකයෙක්.'' ඔහු කීවේය.'' ඔයාට මතකද මේ අනාගත බලාපොරොත්තුම තිබ්බ පරණ යාළුවෝ දෙන්නෙක්ව?''

'' නෑ, මතක නෑ. තමුන්ලා මට කියන දෙයක් කියලා යනවද? මට ගොඩක් වැඩ තියෙනවා.'' ඔහු යළිත් කෝපන්විතව කීවේය.

'' තිවංක අයියේ. අපි යමු. මේ මනුස්සයාට අපිව මතක නෑ.'' එසේ කියූ සිරිමල් ආපිට හැරුණේය.

'' පොඩ්ඩක් ඉන්න. කෙවින් ඔවුන්ව නැවැත්වූයේ ය. අනතුරුව ඔහු මදක් නිසොල්මනේ සිටියේය. '' ඔයා තිවංක බණ්ඩාර ද?''

'' ඔව් ''

'' එතකොට මේ සිරිමල් ද?'' සිරිමල් තම හිස සලමින් එය පිළිගත්තේ ය.

'' අනේ මට සමාවෙන්න, මට ඔයාලව අඳුරගන්ට බැරි වුණා.''

'' මොකද මනුස්සයෝ ඔච්චර සැර? එදා එයාර්පෝට් එකේදී තමුසේ මගේ ඇඟෙත් හැප්පිලා ගියා. ඒවත් හැරිලා බැලුවය.''

'' මොකෝ එකපාරටම ලංකාව මතක් උනේ?'' සිරිමල් විචාළේය.

'' මං මේ රිසර්ච් වගේකට ආවා.''

'' ඒ කියන්නේ ඔයා දැන් පුරාවිද්‍යාඥයෙක් ද?

'' ඔව් මල්ලි.'' ඔහු කීය. මොකෝ ඔයාල මේ පැත්තෙ?''

'' මල්ලි ඔයාට දීපු පොරොන්දුව ඉෂ්ට කරලා.''

'' මොකක්ද?'' තිවංකගේ වචන ට බාධා කරමින් කෙවින් විමසුවේය.

'' මං අපිව පැහැරගත්තු සිද්ධිය ගැන පොතක් ලිව්වා. ඒකට මට රාජ්‍ය සම්මානත් හම්බ වුණා. ඉතින් ඒ නිසා මගේ යාළුවෝ පාටි එකක් ලෑස්ති කරල, ඉතින් අපි ඒකට ආවා.'' සිරිමල් කීය.

'' ඒ කියන්නෙ ඔයා ඒ පොත ලිව්ව ද?'' මට සමාවෙන්න ඔයාට දීපු පොරොන්දුව ඉෂ්ට කරන්න බැරි උනාට.''

''ඒකට කමක් නෑ. ඒත් ඇයි ඔයා අපිට කෝල් කරේ නැත්තෙ?''

'' මම ඇක්සිඩන්ට් වුණා. ඒ නිසා අවුරුදු දෙකක් විතර එක්තැන් වෙලා හිටියා.''

'' ඒ කිව්වේ?'' තිවංක විමසුවේ මහත් වූ විස්මයෙන්ය.

'' මට හැම දෙයක්ම අමතක වෙලා තිබුනේ.''

'' අපිට කණගාටුයි ඔයා ගැන. අපි ඔයා ගැන වැරදියට හිතුවා.'' තිවංක කණගාටුවෙන් කීවේය.

'' ඔව් අයියේ, අපිට සමාවෙන්න. සිරිමල් කීවේය. හරි අපි දැන් ඒ හැමදේම අමතක කරමු. කෙවින් අයියටත් පුළුවන් මගේ පාටියට එන්න.''

'' ආ හරි අපි යමු.'' ඔහු මහත් උද්‍යෝගයෙන් කීවේය. යහළුවො තිදෙන කලකට පසුව එක්වීමේ ප්‍රීතියෙන් මහත් සේ විනෝද වූහ.

## 08.නික්ම යාම

''පුතා ටීවි එක දාන්ටකෝ.'' මව තම පුත්‍රයාට හඬ ගෑවේය. ''අද අර වැඩසටහනට එන්නේ අර ප්‍රසිද්ධ ලේඛකයා සිතුම් මහත්තයා.'' පුතු මවගේ ඉල්ලීම ඉටු කොට මව සමග ආලින්දයේ අසුන් ගත්තාය.

'' ඉතින් සිරිමල් මහත්තයාගේ 'මල් වීදුරු' නවකතාව ගැන අපි දැන් කතා කරමු.''

'' අයියෝ වැඩසටහන බාගයක් ගිහිල්ලා.'' නිවේදිකාවගේ හඬට ඇහුම්කන් දෙමින් මව කීවාය.

***************

'' ඇයි ඇත්තටම පාඨකයෝ මේ පොතට මෙතරම්ම ආසා? ඔබතුමා මොකක්ද ඒ ගැන හිතන්නේ?'' නිවේදිකාව සිරිමල්ගෙන් පිළිතුරක් බලාපොරොත්තු වූවාය.

'' ඔව්, මං හිතන විදිහට නම් පාඨකයෝ ඒ පොතට ඒ තරම්ම ආස මේ පොතේ තියෙන්නේ ඇත්ත සිදුවීමක් නිසා වෙන්න ඇති.

'' ඇත්තටම ඒක ඇත්තම සිදුවීමක් ද?''

'' ඔව්, ඇත්තටම කිව්වොත් මේකේ තියෙන්නේ මගේම ජීවිත කතාව.''

'' ඔබතුමා කැමති නැද්ද අද මේ වැඩසටහන නරඹන ප්‍රේක්ෂකයින්ට ඒ ගැන ටිකක් කියන්න.''

'' අනිවාර්යෙන්ම. ඇත්තටම මම පිටිසර ගමක ඉපදුනු දුප්පත් දරුවෙක්. මං ගෙදරින් පැනලා ගිහින් කැලෑවැදුණු බංගලාවක ජීවත් වුණා. ඒ අතර වාරයේ දී මට වික්‍රම මාමාව මුණගැහුණා. එතුමා මට මේ ගමනට මහත් රුකුලක් වුණා. ඒ වගේම නැන්දත්. ඉතින් මං කොළඹ ආවා. ඒ ආපු අලුත මාවයි තව අයියා කෙනෙක්වයි පිරිසක් විසින් පැහැර ගත්තා. වාසනාවකට අපි ඒ මිනිසුන්ගෙන් ගැලවුනා.

ඒත් අපි ඒ පාළු කැලෑවේ අතරමං වුණා. ඉතින් අවුරුද්දකට පස්සෙ ගොඩක් දුක් විඳලා කොහොමහරි අපි බේරුනා. ඉතින් මං ආයෙත් කොළඹ ඇවිත් විභාග පාස් වෙලා විශ්වවිද්‍යාලයේ ගියා. ඉතින් එහෙම තමයි මං අද මේ ඉන්න තැනට ආවේ.''

'' ඉතින් ඔබතුමාට අද සමාජයේ දූල පුතාලා වෙනුවෙන් වචනයක් තියන්න පුළුවන් නේද?'' නිවේදිකාව විමසුවාය.

'' ඔව්, අනිවාර්යෙන්ම.''

'' ආදරණීය දුවේ පුතේ, තමන්ට නැති දේවල් ගැන දුක් නොවී ඇති දේවල් ගැන හිතන්න. තමන්ගේ හැකියාවන් අඳුනගෙන ඒ වෙනුවෙන් කැප වෙන්න. ඒ වගේම තමන්ට කොච්චර බාධාවන් ආවත් ඒවට හොඳට මුහුණ දීලා තමන්ගේ ඉලක්කයටම යන්න. එතකොට ඔයාලට ලෝකේ දිනන්න පුළුවන්.''

නිමි!

මල් වීදුරු

# ස්තූතිය

මා හට සාහිත්‍ය නිර්මාණකරණය කිරීමේ හැකියාව හිමි වූයේ නිරතුරුවම විෂයභාර පොතපත කියවීම නිසාවෙනි යැයි මම සිතමි. ඉතියෙන් ප්‍රථමයෙන් කුඩා කල සිටම විෂය බාහිර පොතපත කියවීමට මා යොමු කල අම්මාටත් අප්පච්චිටත් මාගේ හදපිරි ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

මා හට පෙර පාසලේ සිට මේ දක්වා අධ්‍යාපනය ලබාදුන් ගුරු මෑණිවරුන් හා ගුරු පියවරුන්ට මා බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි.

මහනුවර ගෝතමී බාලිකා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරණ සමයේ මෙම ග්‍රන්ථය රචනා කිරීමට මා හට  බෙහෙවින් උපකාර කළ නිලුක්ෂි රාජපක්ෂ ගුරුතුමියටත් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයීය විද්‍යුත් පොත් රචනා කිරීමේ සංගමයේ නියමුවාණන් වන ගුරු විදුහල්පතිනි ශෂිකලා සේනාධීර ගුරු මෑණියන්ටත් සෙනෙවිරත්න ගුරු පියාණන්ටත් මා බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

තවද මෙම ග්‍රන්ථයේ පිට කවරය සඳහා සිතුවම් නිර්මාණය කල මාගේ මිතුරිය වන තවිසි චිත්‍රා සොයුරියටත් මා හට නන් අයුරින් උපකාර කල සියලුම දෙනාටත් මාගේ හද පිරි ස්තූතිය පුද කර සිටිමි.

සේසතිනි දිල්මිණී යාලිංගසිංහ
අංක 134, අත්තරගම,
පට්ටියාවත්ත,
මහනුවර.
2023-10-19



**ISBN**
ISBN 978-624-206-852-7

**Bar Code**
9 786242 068527